# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 41,569 — 1965 නොවැම්බර් 26 වැනි සිකුරාදා — 1965.11.26

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (II) ජේදය—පලකිරීම්

(මෙහි වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් පත් වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 1457 | නොවුම්පල් ටෙන්ඩර් හා වෙනත් ටෙන්ඩර් විභාගය ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | ආරක්ෂිතාංශ නොවන දැන්වීම ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම ... ... ... | 1465 | රට බිම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම ... | 1482 | වෙන්දේසි බිරිම පිළිබඳ දැන්වීම ... ... | 1485 |
| ඩිඩුකාතිරාදිය විකිණීම ... ... ... | 1482 | විවිධ දැන්වීම ... ... ... | 1485 |


[සැලකිය යුතුයි.—මෙවර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් පත්‍රයේ V වැනි කොටසට අතිරේකයක් වශයෙන් 1962 අප්‍රේල් සිට ජූනි දක්වා පලකරන ලද පුස්තක නාමාවලියක් අඩංගු වේ.]

## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

දීමනා.—ජෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මේ දීමනා ඒ සම්බන්ධයෙන් අනන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. සේවා කොන්දේසි.—පත්වීම් වූ සැලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. ඊට අතිරේක වශයෙන් සවකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩදෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේදී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට පම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා මෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, යථා යෝග්‍ය පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරනු ලබන නව ප්‍රවේශකයන්ගේ ආධුනික/පරීක්ෂා කාලය අවුරුදු තුනක් වන්නේ ය.

(ii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත්, විශේෂයෙන් ම වර්ෂ 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින්මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූලව නව ප්‍රවේශකයන් ක්‍රියා කළ යුතුය.

(iii) (ඒ) ඔවුන් තම ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයයෙන් ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(බී) ආධුනික/පරීක්ෂා කාලය ගත වී අවසන් වූ විට සේවයෙහි ස්ථිර කරන්නේ වෙනත් කරුණු අතර කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වය හෙක් වර්ග කර ඇති සිංහල ප්‍රවීණතා පරීක්ෂණවලින් ඔවුන් නියමිත කාලය ඇතුළත සමත්වීම් ලබය. නියමිත කාලසීමාව ඇතුළත මෙම ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත්වීමට අපොහොසත් වුවහොත් ඒවා සමත්වන තෙක්, ලැබිය යුතු පඩි වැඩිවීම් නොගෙවා හැරීම එහි ප්‍රතිඵලය වන්නේ ය. තම ආධුනික/පරීක්ෂා කාලය කෙළවර වන විට කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වයේ විභාගයෙන් සමත් නොවන යම් නිලධාරියෙක් වේ නම් ඔහුගේ සේවය කෙළවර කළ හැකි වන්නේ ය.

සංලක්ෂ්‍යය.—සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබා රාජ්‍ය සේවයට බැඳෙන අය සේවයෙහි ස්ථිර කිරීමට පෙර සිංහල ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත්වීමේ නියමයෙන් නිදහස් වෙති.

(iv) මෙම ධුරයෙහි සේවය ස්ථිර කරන දින සිට අවුරුදු දෙකක් ඇතුළත සිංහල භාෂාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වයේ කාර්යක්ෂමතා කඩඉම පරීක්ෂණයකින් සමත් වීමටද ඔවුන්ට නියම වනු ඇත.

5. අවශ්‍ය සුදුසුකම්.—(i) තමා ලාංකිකයෙකු වූ බවට සෑහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවකු විසින් ඉදිරිපත් කළ යුතුය. "ලාංකික" යනුවෙන් සඳහන් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

(ii) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට උසස් විභාගයකින් සමත්ව සිටීම අවම අධ්‍යාපනික සුදුසුකම් ලෙස නියමකොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන්නකු සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලත් සිංහලයකු වෙතොත් ඔහු ජ්‍යෙෂ්ඨ

පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් සිංහල භාෂාව විෂයයෙන් හෝ ඊට සමාන විෂයයකින් හෝ සාමාර්ථය ලබා තිබිය යුතුය. (වර්ෂ 1961 ජනවාරි 1 වෙනිදාට පෙර සිට රාජ්‍ය සේවයේ යෙදී සිටියාවූ ද රාජ්‍ය සේවයේ වෙනත් තනතුරු ලබනු කැමැත්තා වූද නිලධාරීන් සම්බන්ධයෙන් මෙම නියමය අදාළ නො වන්නේ ය.)

6. **යුද්ධ සේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සැම අයුරෙකම, සුදුසුකම් ලැබ සිටින්නාවූ ද, මහා රාජිණියන් වහන්සේ ගේ යුද්ධ හමුදාවන් හි යෙදී සිටි සේවාමුක්ත වූද අයට සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහාජනාරක්‍ෂක සේවාව යන මෙම සේවාවන් හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිට (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස්වූවන් හැර) සැම කෙනකුටම ද ඔවුහු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැදී සතුවුදයක ලෙස නොකඩවා සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම් ලබාගැනීම සඳහා පමණක් ඉතා ඈතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර් 31 වැනි දිනත් යන මෙදා තුර තමන් එසේ සේවයෙහි යෙදී සිටි කාලපරිච්ඡේදය තම වයසින් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

7. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින අවශ්‍ය සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ සවකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. තව ද, තමන්ගේ ඉල්ලුම් පත්‍රයේ දෙවන පිටපතක් ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දින හෝ ඊට පෙර ලැබෙන සේ එම නිලධාරියා විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්තැන වෙත කෙළින්ම යැවිය යුතුය. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරන නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමේ දී, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු එම ඉල්ලුම්කරුවන් (තෝරා ගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූලව ඔවුන් ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම් ව සිටින් ද, නැද්ද යි සඳහන් කොට එවිය යුතු ය.

(ii) සම්මුඛ පරීක්‍ෂණයක් සඳහා නියමිත වේලාවක දන්වනු ලබන තැනකට පැමිණෙන ලෙස අපේක්‍ෂකයන්ට නියම කරනු ලැබිය හැකිය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iii) කිසියම් අපේක්‍ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්‍ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්‍ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්‍ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

(iv) යම් අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණිනම් රාජකාර්යයෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නිගමනයන්ට කවර ලෙසකින් වුවත් නො ගැළපෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්‍ෂේප කරනු ලැබේ.

8. **සුදුසුකම් ලැබීම සඳහා වැටුප් යන්නෙහි විග්‍රහය.**—සුදුසුකම් ලැබීම සඳහා වැටුප් යනුවෙන් අදහස් කරනුයේ මූලික ස්ථිර තනතුරේ වැටුප පමණි. වැඩ බැලීම සඳහා ගෙවන වැටුප් දීමනා ආදිය කිසිවක් ඊට ඇතුළත් නොවේ.

---

## පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

### කාර්මික සහකාර තනතුර

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කාර්මික සහකාර තනතුරක් සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම්පත් 1965 දෙසැම්බර් මස 11 වෙනිදා තෙක් භාරගනු ලැබේ. නියමිත දිනට හෝ ඊට පෙර පහත සඳහන් ආකෘති පත්‍රය ප්‍රකාරයට ඉල්ලුම් පත් එවිය යුතුයි.

2. වැටුප.—මේ තනතුර සඳහා වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 1,620—120—රු. 3,780 වෙයි.

3. වයස් සීමාව.—1965 දෙසැම්බර් මස 11 වෙනිදාට වයස අවුරුදු 21ට නොඅඩු අවුරුදු 30ට නොවැඩි විය යුතුය. දැනට රජයේ සේවයේ නියුක්ත වූවන් සඳහා වැඩි වයස් සීමාව බල පාන්නේ නැත.

4. **අධ්‍යාපන සුදුසුකම්.**—පිළිගත් විශ්ව විද්‍යාලයක භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව ඇතුළු විද්‍යාව පිළිබඳ මධ්‍ය පරීක්‍ෂණයෙන් හෝ ඊට සමාන විභාගයකින් සමත් වී සිටීම. ඡායාරූප ශිල්පය පිළිබඳ දැනීමක් තිබීම අතිරේක සුදුසුකමක් හැටියට සලකනු ලැබේ.

5. **සේවා කොන්දේසි :**

(1) තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

(2) පත් කරනු ලබන්නාට වැන්දඹු හා අනත්දරු අරමුදලට දායක මුදල් ගෙවීමට නියම කෙරෙන්නේ ය.

(3) පත්වීම අවුරුදු තුනක ආධුනික කාලයකට යටත්ව කරනු ලැබේ.

(4) තෝරාගනු ලබන අපේක්‍ෂකයා රජයේ භාෂා ප්‍රතිපත්තිය, විශේෂයෙන්ම වර්ෂ 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනත, ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලටත් මින් ඉදිරියට පනවනු ලබන ව්‍යවස්ථාවලටත් අනුකූලව ක්‍රියා කිරීමට බැඳී සිටින්නේ ය.

(5) තෝරාගත් අපේක්‍ෂකයා තම ආධුනික කාලය තුළදී සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණත්වයක් ලබාගත යුතුයි. සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්‍ෂණවලින් සමත්වීම ආධුනික කාලය අවසානයේදී ඔහුගේ පත්වීම ස්ථිර කිරීමට අවශ්‍ය වන සුදුසුකම් අතරින් එකක් වනු ඇත.

(6) තෝරාගත් අපේක්‍ෂකයා තමා තනතුරේ ස්ථිර කරනු ලැබීමෙන් අවුරුදු 2 ක් ඇතුළත අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය විභාගයේ තත්ත්වයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගයක් සිංහල භාෂාවෙන් සමත් විය යුතුයි. එසේ කිරීමට අසමත් වුවහොත්, පඩි වැඩිවීම් පමා කරනු ඇත.

(7) ස්ථිර තනතුරක් උසුලන නිලධාරියකු තෝරාගනු ලැබුව හොත් ඔහු වැඩ බැලීමට පත් කරනු ඇත.

6. ඉල්ලුම්කරුවන් මනා ශරීර ශක්තියෙන් හා හොඳ චරිතයකින් යුක්ත විය යුතුයි. චරිතය පිළිබඳ ළඟදී ලබාගත් සහතික දෙකක පිටපත් ඉල්ලුම් පත්‍රයට ඇමිණිය යුතුයි.

7. ඉල්ලුම් පත් පුරාවිද්‍යා කොමසාරිස්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ 7 කියා එවිය යුතුයි. මේවා පුරාවිද්‍යා කොමසාරිස්ගේ හෝ මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පුද්ගලික නමට නොඑවිය යුතුයි.

8. මෙම ගැසට් පත්‍රයේ I වෙනි කොටසේ (II) වෙනි ඡේදයේ මුල පළ කර ඇති රාජ්‍යසේවා තනතුරු සඳහා කෙරෙන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි කෙරෙහි සැලකිල්ල යොමුකරනු ලැබේ.

චාල්ස් ගොඩකුඹුරේ,
පුරාවිද්‍යා කොමසාරිස්.

1965 නොවැම්බර් මස 17 වෙනි දින,
කොළඹ 7,
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේදීය.

### ආකෘති පත්‍රය

**කාර්මික සහකාර තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය**

1. සම්පූර්ණ නම :————.

2. ලිපිනය :————.

3. (අ) උපන් දිනය :————.

(ආ) 1965.12.11 වෙනි දිනට වයස :——.
අවුරුදු :——, මාස :——, දින——, (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි).

4. අධ්‍යාපනික සුදුසුකම් (සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි) :————.

5. දැනට රක්ෂාවක් කරයි නම් ඒ පිළිබඳ විස්තර :————.

6. චරිත සහතික ලබාගත්තේ කාගෙන් ද ? :—

(1) ————.
(2) ————.

7. **වෙනත් සුදුසුකම් :————.**

මෙම අයදුම් පතෙහි මා විසින් සපයා ඇති විස්තර සත්‍ය හා නිවැරදි ඒවා බැව් මෙසින් සහතික කරමි. මෙහි අඩංගු විස්තර අසත්‍ය හෝ වැරදි හෝ බව අපේක්ෂකයින් තෝරා ගැනීමට පෙර සොයාගනු ලැබුවහොත් තනතුර සඳහා මා නුසුදුස්සෙක් වීමටත් පත්වීම ලැබීමෙන් පසුව සොයාගනු ලැබුවහොත් කිසිම වන්දි ගෙවීමක් නොමැතිව රක්ෂාවෙන් මා අස්කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**7–1121—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය**

## කාර්මික අධ්‍යාපනය හා පුහුණුකිරීම පිළිබඳ දෙපාර්තමේන්තුව

### මෝටර් කර්මාන්තය පිළිබඳ ජ්‍යෙෂ්ඨ උපදේශක තනතුර

කාර්මික අධ්‍යාපනය හා පුහුණුකිරීම පිළිබඳ දෙපාර්තමේන්තුවේ මෝටර් කර්මාන්තය පිළිබඳ ජ්‍යෙෂ්ඨ උපදේශක තනතුර සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල වූ ඉල්ලුම් පත් 1965 දෙසැම්බර් 11 වැනි දිනට හෝ ඊට ප්‍රථම මා වෙත එවිය යුතු ය.

2. **බඳවා ගැනීමේ සහ සේවා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය. වැන්දඹු හා අනාථ දරු විශ්‍රාම වැටුප් අර මුදලට දායක මුදල් ගෙවිය යුතු ය. පත්වීම තුන් අවුරුදු ආධුනික කාල සීමාවකට යටත් වේ. දැනට රජයේ ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරන නිලධාරියකු තෝරා ගනු ලැබුවහොත් ඔහු නියමිත කාලයක් වැඩ බැලීමේ පදනම මත පත් කරනු ලැබේ.

3. **වැටුප් ක්‍රමය.**—රු. 3,900 වාර්ෂික වැටුපෙන් පටන් ගෙන රු. 180 වාර්ෂික වැටුප් වැඩිවීම් 9 කින් අනතුරුව රු. 360 වාර්ෂික වැටුප් වැඩිවීම් 8 කින් රු. 8,400 වාර්ෂික වැටුප දක්වා වැඩි වේ.

4. **අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක්ම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය :—

(i) 1965-12-11 වැනි දිනට වයස අවුරුදු 30 ට නො අඩු, 45 ට නො වැඩි විය යුතු ය. (දැනට රජයේ සේවයේ නියුක්ත නිලධාරීන්ට ඉහළ වයස් සීමාව අදාළ නොවේ),

(ii) විශිෂ්ට චරිතයෙන් හා යහපත් සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත බව,

(iii) (අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ,

(ආ) දෙකකට නො වැඩි වාර ගණනක දී සිංහල හෝ දෙමළ භාෂාව සහ අංක ගණිතය හෝ ගණිතය ඇතුළුව විෂයයන් 6 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ,

(ඇ) ඊට සමාන හෝ උසස් විභාගයකින් සමත් වී සිටිය යුතුය.

(ඈ) ලන්ඩනයේ සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් ආයතනයේ මෝටර් වාහන යාන්ත්‍රික වැඩ හෝ මෝටර් වාහන විදුලි ශිල්පීන්ගේ වැඩ හෝ මෝටර් කාර්මිකයන්ගේ වැඩ පිළිබඳ අවසාන සහතිකය.

(ඉ) ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන් ගේ (විදුලි සහ යාන්ත්‍රික ඉංජිනේරු) සහතිකය හෝ සන්ධ්‍යා ඉංජිනේරු සහතිකය.

හෝ (ඊ) ගල්ඔය සංවර්ධන මණ්ඩලයේ කාර්මික අභ්‍යාස ආයතනයේ ඩිප්ලෝමා (යාන්ත්‍රික) සහතිකය.

හෝ (උ) සමාන කාර්මික අධ්‍යාපන සුදුසුකම්.

සහ (ඌ) අපේක්ෂකයින්ට සිංහලෙන් ඉගැන්වීමට හැකියාවක් තිබිය යුතුය. නැතහොත් පත්වීමේ දින සිට අවුරුදු තුනක් ඇතුලත දී සිංහලෙන් ඉගැන්වීමට පුළුවන් කමක් ලබාගත යුතුය.

**සටහන.**—පත්කර ගනු ලබන්නා සෑහෙන ප්‍රායෝගික සහ/හෝ ඉගැන්වීමේ පළපුරුද්ද ලබා තිබිය යුතු අතර, අවුරුදු 10 කට අඩු පළපුරුද්දක් ඇති අයකු තෝරා ගනු ලැබුවහොත් ඔහු අවශ්‍ය පළ පුරුද්ද ලබා ගන්නා තෙක් වසකට රු. 3,900 ක නියමිත වැටුපක් මත වැඩ බැලීමේ පදනමක් උඩ පත් කෙරෙනු ඇත.

5. රජයේ සේවයේ නියුතු සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් තම තමන්ගේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානීන් මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය. ඉහතින් සඳහන් කළ දිනයට පසු එවන අයදුම් පත් භාරගනු නො ලැබේ. එහෙත් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාට නියම අවස්ථාවේදී ලැබී ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණය ඉදිරිපත් කර නිර්දේශ කළහොත් පමණි යථෝක්ත ප්‍රමාදවී ලැබෙන අයදුම් පත් භාරගනු ලබන්නේ.

6. අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන ලියවිලි පිටපත් (මුල් පිටපත් නොවේ) ඉල්ලුම් පත්‍රවලට අමුනා එවිය යුතු ය :—

(අ) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතිකය හෝ උපකාර පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථාවන්හි සඳහන් කටයුතු පිණිස නිකුත් කර ඇති සහතික භාරගනු නොලැබේ).

(ආ) ලබා ඇති උසස් ම ශාස්ත්‍රීය හා වෘත්තීය සහතිකය.

(ඇ) අයදුම්කරුවන්ගේ සුදුසුකම්, චරිතය සහ තනතුරට ඇති සුදුසුකම් පිළිබඳව සහතික 3ක්.

(සැලකිය යුතුයි.—දැනට රජයේ සේවයේ නියුතු අයදුම් කරුවන් විසින් ඉහත (ඇ) අනුඡේදය අනුව සහතික ඉදිරි පත් කිරීම නුවුවමනා ය.)

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසෙහි (II) වැනි ඡේදයෙහි පටන් ගැන්මෙහි පලකර තිබෙන රජයේ තනතුරු සඳහා පත් කිරීම් වලට අදාල පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

එස්. එල්. ද සිල්වා,
වැඩ බලන අධ්‍යක්ෂ.

1965 නොවැම්බර් 16 වෙනි දින,
රත්මලානේ,
කාර්මික අධ්‍යාපනය හා පුහුණුකිරීම පිළිබඳ දෙපාර්තමේන්තුවේ දී.

### ආදර්ශ ආකෘති පත්‍රය

**කා.අ.හා.පු.දෙ. මෝටර් කර්මාන්තය පිළිබඳ ජ්‍යෙෂ්ඨ උපදේශක තනතුර**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :———.

2. නිත්‍ය ලිපිනය :———.

3. වයස හා උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතු ය) :———.

4. ජාතිය :———.

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :———.

(ආ) අයදුම්කරුගේ පියා :———.

(ඇ) අයදුම්කරුගේ සීයා :———.

(ඈ) අයදුම්කරුගේ සීයාගේ පියා :———.

අයදුම්කරු උපන්නේ ලංකාවේ නම් (අ) වලට අමතරව (ආ) නැතහොත් (ඇ) සහ (ඈ) යන දෙකම පිරවිය යුතුයි. අයදුම්කරු ලංකාවේ නොඋපන්නේ නම් (අ) වලට අමතරව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) වෙනම පිරවිය යුතු ය.

6. විවාහක හෝ අවිවාහක බව :———.

7. දැන්වීමෙහි පලකර ඇති අන්දමට අධ්‍යාපන සහ අනිකුත් සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ විස්තර (සහතිකවල පිටපත් ඇමිණිය යුතු යි) :———.

8. ඉගෙනිම ලැබූ ස්ථානය සහ අස්වූ දිනය :———.

9. පාසල හැර යාමෙන් පසු කල රක්ෂාවල්, ඒවායේ විස්තර : ———.

10. ඔබ රාජකීය හමුදාවක සේවය කර තිබේ ද ? එසේ නම් ඒ සේවය පිළිබඳ සම්පූර්ණ විස්තර :———.

11. චරිතය පිළිබඳ සහතික ලබා ඇති අයගේ නම සහ තරා තිරම් : (ඒවායේ පිටපත් ඇමිණිය යුතු යි) :———.

12. දැනට රක්ෂාවක් කරන්නේ නම් එය :———.

මේ අයදුම් පතෙහි සඳහන් කොට තිබෙන සියළුම විස්තර නිවැරදි සත්‍ය කරුණු බව මෙයින් සහතික කර ප්‍රකාශ කරමි. යම් හෙයකින් මෙහි සඳහන් කිසිවක් වැරදි බව හෝ අසත්‍ය බව හෝ ඔප්පුවුව හොත් මේ පදවියට මා පත්වීමට නුසුදුස්සකු වන බව හා පත් වීමෙන් පසුව ඉහත කී කරුණුවල අසත්‍යතාවයක් ඔප්පුවුවහොත් කිසිම වන්දියකට මා අහිමි වී පදවියෙන් පහකර දමනු ලැබීමට ද හේතුවන බව හොඳාකාර දන්නා බව ද ප්‍රකාශ කරමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—.

11-986—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය.

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

### ෆෝමන් තනතුර (කාර්මික)

මෙම දෙපාර්තමේන්තුවේ ෆෝමන් (කාර්මික) තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ :—

2. වැටුප් පරිමාණය : වර්ෂයකට රු. 1,860—120—රු. 2,580.

3. වයස් සීමාව : 1965.12.12 වන දිනට වයස අවුරුදු 20 කට නොඅඩු විය යුතු අතර 35 කට නො වැඩි විය යුතුයි. දැනට රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ට මෙම වයස් සීමාව බලපානු නො ලැබේ.

4. අධ්‍යාපනික සහ වෙනත් සුදුසුකම් :—

(1) (අ) සම්මාන තුනක් සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඒ හා සමාන විභාගයකින් සමත් ව තිබීම සහ

(ආ) යාන්ත්‍රික ඉංජිනේරු ශිල්පය විෂයයක් වශයෙන් ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ පාඨ මාලාව හදාරා තිබීම,

හෝ

ගල් ඔය සංවර්ධන මණ්ඩලයේ (ජී.ඕ.ඩී.බී.) යාන්ත්‍රික ඉංජිනේරු ශිල්පය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය.

සැ. යු : ශීත ගබඩා පරිපාලනය පිළිබඳ අත් දැකීම් ඇති අයට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

(ii) ඉහත සඳහන් (i) (අ) සහ (ආ) යටතෙහි සුදුසුකම් නොමැති ඉල්ලුම්කරුන්ට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතු වේ :—

(අ) කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත්ව රජයේ හෝ පෞද්ගලික අංශයේ හෝ පිළිගත් ආයතනයක ආධුනිකයකු වශයෙන් යාන්ත්‍රික වැඩ පොලක යටත් පිරිසෙයින් අවුරුදු 3 ක වත් පුහුණුවක් ලබා තිබීම.

(ආ) ඉහත කී පුහුණුව ලැබීමෙන් පසුව කාර්මිකයෙකු වශයෙන් යටත් පිරිසෙයින් අවුරුදු 10 ක් වත් රජයේ හෝ පෞද්ගලික අංශයක හෝ පිළිගත් ආයතනයක සේවය කර තිබීම හා ටොන් 200 කට නො අඩු ශීත ගබඩාවක් නඩත්තු කිරීමට හා පාලනය කිරීමට පුහුණුවක් ලබා තිබීම.

5. සේවයට බඳවා ගැනීමේ කොන්දේසි :—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය. ස්වකීය වැටුපෙන් සියයට පහක් (5%) රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

6. අයදුම්කරු විසින් ඉල්ලුම් පත්‍ර සමග පහත සඳහන් සහතික පත් වල පිටපත් පමණක් අමුණා එවිය යුතු ය :—

(අ) උප්පැන්න සහතිකය (සැ.යු. බව්තීස්ම පිළිබඳ සහතික පත්‍ර හෝ ආධාර ලබන පාඨශාලා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් වන කටයුතු සඳහා දෙනු ලබන සහතික පත්‍ර හෝ භාර ගනු නො ලැබේ.)

(ආ) අයදුම්කරු ලබා ඇති උසස් ම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතික පත්‍ර,

(ඇ) කාර්මික සහ වෘත්තීය දැනුම පිළිබඳ සහතික හා,

(ඈ) ළඟදී ලබා ගන්නා ලද චරිතය පිළිබඳ සහතික පත් 3 ක්.

7. මෙම ගැසට් පත්‍රයේ පළමු වන කොටසේ දෙවන ඡේදයේ මුලින් දැක්වෙන රාජ්‍ය සේවයේ තනතුරු වලට පත් කිරීම පිළිබඳ වූ සාමාන්‍ය කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

8. මෙහි පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව පිළියෙළ කර ගත් අයදුම් පත් 1965 දෙසැම්බර් මස 13 වැනි දිනට හෝ ඊට පෙර අලෙවි කිරීමේ කොමසාරිස්, තැ. පෙ. 562, කොළඹ 1 යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු ය.

කේ. බී. දිසානායක,
වැ. බ. අලෙවි කිරීමේ කොමසාරිස්.

1965 නොවැම්බර් මස 16 වන දින,
කොළඹ 1, අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේදීය.

### අයදුම් පත් ආකෘති පත්‍රය

#### ෆෝමන් (කාර්මික) තනතුර—අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

1. සම්පූර්ණ නම :———.
    (අ) පෙලපතේ නම :———.
    (ආ) වෙනත් නම් :———.

2. පෞද්ගලික ලිපිනය :———.

3. උපන් දිනය සහ 1965.12.12 දිනට වයස :———.

4. ජාතිය :———.

5. ඔබ ලංකාවේ පුරවැසියකු වන්නෙහි ද ? එසේ නම් :———.
    (අ) උත්පත්තියෙන් ද :———.
    (ආ) ලියා පදිංචි වීමෙන් ද :———.

6. අධ්‍යාපනික සුදුසුකම් (සමත් වූ විභාග සඳහන් කරන්න) : ———.

7. කාර්මික සුදුසුකම් (සමත් වූ විභාග සඳහන් කරන්න) :———.

8. පුහුණු වීම හා පළපුරුද්ද පිළිබඳ විස්තර (දින සහිතව සත්‍ය හා නිවැරදි විස්තර දැක්විය යුතුයි) :———.

9. දැනට රක්ෂාවක් කරයි නම් එය :———.

10. තමා කලින් රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක හෝ රජයේ අධි පාලනය පිට පවත්නා කිසියම් ආයතනයක සේවය කර ඇත්නම් ඒ පිළිබඳ විස්තර :———.

11. නිවේදනයේ 6 (ඇ), (ඈ) අනුව සහතික පත්‍ර ලබා ගත් අයගේ නම් සහ තනතුරු :——.
    (1) ———.
    (2) ———.
    (3) ———.

මෙම අයදුම් පතේ සඳහන් කොට තිබෙන සියළුම විස්තර නිවැරදි හා සත්‍ය කරුණු බව සහතික කරමි. යම් හෙයකින් මෙහි සඳහන් කිසිවක් වැරදි බව හෝ අසත්‍ය බව හෝ ඔප්පු වුවහොත් කිසිම වන්දියකට මා අහිමි වී පදවියෙන් පහ කර දමනු ලැබීමට ද හේතු වන බව හොඳාකාර දන්නා බව ද ප්‍රකාශ කරමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

11-1002/1—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

### විදුලි ෆෝමන් තනතුර

මෙම දෙපාර්තමේන්තුවේ විදුලි ෆෝමන් තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ :—

2. වැටුප් පරිමාණය : වර්ෂයකට රු. 1,860—120—රු. 2,580.

3. වයස් සීමාව : 65.12.12 වන දිනට වයස අවුරුදු 21 ට නොඅඩු විය යුතු අතර, 35 කට නොවැඩි විය යුතුයි. දැනට රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ට මෙම වයස් සීමාව බලපානු නො ලැබේ.

4. අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම් :

(1) (අ) ගණිතය හා භෞතික විද්‍යාව විෂයයක් වශයෙන් ඇතිව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත්වීම,

හෝ

(ආ) දෙකකට වැඩි නොවන වාර ගණනකදී ගණිතය හා භෞතික විද්‍යාව ඇතුළුව විෂයයන් හයකින් ලබා ගත් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) සහතික, හෝ

(ඇ) ඊට සමාන විභාගයකින් හෝ සමත් වීම.

සහ

(2) (අ) ලංකා කාර්මික විද්‍යාලයේ විදුලිය හා කාර්මික අංශ පිළිබඳ සවස් වරුවේ පවත්වන පාඨ මාලාවන්ගේ සහතිකය, හෝ

(ආ) රජයේ විදුලිය දෙපාර්තමේන්තුවේ ආධුනික විදුලි ෆෝමන් වරුන්ගේ පාඨ මාලාව සතුටුදායක පරිදි සම්පූර්ණ කිරීමෙන් පසුව තුන් වැනි ශ්‍රේණියේ විදුලි ෆෝමන් වරුන් සඳහා වූ ප්‍රථම විභාගයෙන් සමත් වීම.

5. සේවයට බඳවා ගැනීමේ කොන්දේසි :—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය. ස්වකීය වැටුපෙන් සියයට පහක් (5%) රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

6. අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍රයට පහත සඳහන් සහතික වල පිටපත් පමණක් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—බව්තීස්ම සහතික පත්‍ර හෝ ආධාර ලබන පාඨශාලා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් වන කටයුතු සඳහා දෙනු ලබන සහතික පත්‍ර හෝ භාර ගනු නොලැබේ.) ;

(ආ) අයදුම්කරු ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතික පත්‍ර ;

(ඇ) කාර්මික සහ වෘත්තීය දැනුම පිළිබඳ සහතික පත්‍ර ;

(ඈ) ලඟදී ලබා ගත්තා ලද චරිතය පිළිබඳ සහතික පත් 3 ක්.

7. මෙම ගැසට් පත්‍රයේ පළමුවන කොටසේ දෙවැනි ඡේදයේ මුලින් දක්වෙන රාජ්‍ය සේවයේ තනතුරු වලට පත්කිරීම පිළිබඳ මූ සාමාන්‍ය කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

8. මෙහි පහත දක්වෙන ආකෘති පත්‍රය අනුව පිළියෙල කරගත් අයදුම් පත් 1965 දෙසැම්බර් මස 13 වෙනි දිනට හෝ ඊට පෙර, "අලෙවි කිරීමේ කොමසාරිස්, තැ. පෙ. 562, කොළඹ 1," යන ලිපිනයට ලියා පදිංචි තැපැලෙන් එවිය යුතුය.

කේ. බී. දිසානායක,
වැ. බ. අලෙවි කිරීමේ කොමසාරිස්.

1965 නොවැම්බර් මස 16 වැනි දින,
කොළඹ 1, අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ දීය.

## අයදුම් පත් ආකෘති පත්‍රය

### විදුලි ෆෝමන් තනතුර—අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුව

(1) සම්පූර්ණ නම :————.

(අ) පෙළපත් නම :————.

(ආ) වෙනත් නම් :————.

(2) පෞද්ගලික ලිපිනය :————.

(3) උපන් දිනය සහ 1965.12.12 වන දිනට වයස :————.

(4) ජාතිය :————.

(5) ඔබ ලංකාවේ පුරවැසියෙකු වන්නෙහිද ? එසේ නම් :—

(අ) උප්පත්තියෙන් ද ? :————.

(ආ) ලියා පදිංචි වීමෙන් ද ? :————.

(6) අධ්‍යාපනික සුදුසුකම් :————.
(සමත්වූ විභාග සඳහන් කරන්න.)

(7) කාර්මික හා වෘත්තීය සුදුසුකම් :————.
(සමත්වූ විභාග සඳහන් කරන්න.)

(8) දැනට රක්‍ෂාවක් කරයි නම් එය :————.

(9) තමා කලින් රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක හෝ රජයේ අධි පාලනය පිට පවත්නා කිසියම් ආයතනයක සේවය කර ඇත්නම් ඒ පිළිබඳ විස්තර :————.

(10) නිවේදනයේ 6 (ඈ) (ඈ) අනුව සහතික පත්‍ර ලබාගත් අයගේ නම් සහ තනතුරු :————.

(1) ————.

(2) ————.

(3) ————.

මෙම අයදුම්පතේ සඳහන් කොට තිබෙන සියළුම විස්තර නිවැරදි සත්‍ය කරුණු බව සහතික කරමි. යම් හෙයකින් මෙහි සඳහන් කිසිවක් වැරදි බව හෝ අසත්‍ය බව හෝ ඔප්පු වුවහොත් කිසිම වන්දියකට මා අහිමි වී පදවියෙන් පහකර දමනු ලැබීමටද හේතුවන බව හොඳාකාර දන්නා බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

1-1002/2—65.11.26 වැනි දින අංක 14,569 දරණ ගැසට් පත්‍රය

---

## ලංකා යුද්ධ හමුදාවේ නිලධාරි තනතුරු සඳහා ඇබෑර්තු

ලංකා යුද්ධ හමුදාවේ ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ නිලධාරි ඇබෑර්තු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

2. තෝරා පත්කර ගනු ලබන අපේක්ෂකයන්ට, ඔවුන්ගේ සුදුසුකම් වලට අනුකූලව, ලංකා යුද්ධ හමුද නිත්‍ය භට හමුදාවේ කපිතාන්, ලුතිනන් හෝ දෙවෙනි ලුතිනන් නිලයෙහි අධිකාර පත්වීම් පිරිනමනු ලැබේ.

3. (අ) පත්වීම ලැබීමේදී තෝරා පත් කර ගනු ලබන ඉල්ලුම් කරුවනට, 1961 යුද්ධ හමුද වැටුප් සංග්‍රහයෙහි නියම කර ඇති පරිදි ඔහුගේ නිලයට අනුකූලව වැටුප් සහ දීමනා ගෙවනු ලැබේ. මේජර් නිලය දක්වා ගෙවනු ලබන මූලික වැටුප් ප්‍රමාණයන් පහත දක්වා ඇති පරිදි වේ :—

| | | |
|---|---|---|
| දෙවෙනි ලුතිනන් | ... | වාර්ෂික වැටුප රු. 4,500 |
| ලුතිනන් | ... | වාර්ෂික වැටුප රු. 4,860—රු. 180 වැඩිවීම් 2 සහ රු. 360 වැඩිවීම් 1—රු. 5,580 |
| කපිතාන් | ... | වාර්ෂික වැටුප රු. 6,660—රු. 180 වැඩිවීම් 6—රු. 7,740 |
| මේජර් | ... | වාර්ෂික වැටුප රු. 8,820—රු. 180 වැඩිවීම් 6—රු. 9,900 |

(ආ) පහත සඳහන් දීමනාද ගෙවනු ලැබේ :—

(i) නිලධාරින් සඳහා වූ නේවාසිකාගාරයක නවාතැන් පහසුකම් සලසා නොමැති නිලධාරීන්ට, රජයේ නිලධාරීන්ට ගෙවීමට රජයෙන් අවසර දී ඇති ගෙවීම් ප්‍රමාණයන්ට අනුව, ජීවනාධාර හා විශේෂ ජීවනාධාර. නේවාසිකාගාරයක ඉඩකඩ පහසුකම් ලබාදී ඇති නිල ධාරීන්ට යුද හමුද වියදමෙන් කෑම බීම් සපයනු ලබන අතර ඔවුනට මෙම දීමනා අහිමි වේ ;

(ii) සේවා හෝ රජයේ විවාහක නිවාසයක් ලබාදී නොමැති විවාහක නිලධාරියෙකුටත්, නේවාසිකාගාර ඉඩකඩ පහසුකම් හෝ ඔහුගේ පදවියට නියමිත විශේෂ නිවාසයක්, ලබාදී නොමැති අවිවාහක නිලධාරියෙකුටත් රජයේ නිලධාරීන්ට ගෙවීමට රජයෙන් අවසර දී ඇති ගෙවීම් ප්‍රමාණයන්ට අනුව සහ නියමිත කොන්දේසි උඩ ගෙවල් කුළී දීමනා ;

(iii) නේවාසිකාගාරය තුළ වාසය කිරීමට අණ ලැබ, නේවාසිකාගාර පහසුකම් සලසනු ලැබ, යුද හමුද වියදමෙන් කෑම බීම සපයනු ලබන කාලපරිච්ඡේදයන් තුළ සෑම සම්පූර්ණ පැය 24ක කාලයක් වෙනුවෙන් විවාහක නිලධාරියෙකුට, දිනකට රු. 1.50 ගෙවීම් ප්‍රමාණය අනුව වෙන්වීමේ දීමනාවක් ගෙවනු ලැබේ. එවැනි කාලපරිච්ඡේදයක් තුළ ජීවනාධාර, විශේෂ ජීවනාධාර, යැපීම් සහ නවාතැන් ගාස්තු ගෙවනු නො ලැබේ ;

(iv) රජයේ නිලධාරීන්ට ගෙවීමට රජයෙන් අවසර දී ඇති ගෙවීම් ප්‍රමාණයන්ට සහ නියමිත කොන්දේසි වලට අනුව ගමන් වියදම් දීමනා (යැපීම්, නවාතැන්, සැතපුම් ගාස්තු, ස්ථාන මාරු දීමනා) ගෙවනු ලැබේ ;

(v) 1961 යුද හමුද වැටුප් සංග්‍රහයෙහි නියම කර ඇති පරිදි අනිකුත් දීමනා (ඇඳුම් පැළඳුම්, නිල ඇඳුම්, නඩත්තු හා මෙහෙකරු දීමනා) ගෙවනු ලැබේ.

(ඇ) උසස් වීම මතු බලාපොරොත්තු වැටුප් සහ සේවා කොන්දේසි පිළිබඳ වැඩි විස්තර කොළඹ, යුදහමුද මූලස්ථානය වෙතින් ලබාගත හැක.

4. අපේක්ෂකයන් විසින් පහත සඳහන් කොන්දේසි සපුරාලිය යුතුයි :—

(අ) ජාතිය—ඉල්ලුම්කරුවන් ලංකාවේ පුරවැසියන් විය යුතුයි ;

(ආ) වයස—ඉල්ලුම්කරුවන් 1965 දෙසැම්බර් 10 දිනට වයස අවුරුදු 33කට නොවැඩිවිය යුතුයි ;

(ඇ) අධ්‍යාපනික/වෘත්තිය සුදුසුකම් :—

(1) (එංගලන්තයේ) යාන්ත්‍රික ඉංජිනේරු ආයතනයේ සහකාර සාමාජිකත්වය (ඒ.ඇම්.අයි මෙක්. ඊ) ලැබූ අය ;
(මෙම වර්ගයෙන් තෝරා ගනු ලබන අයදුම්කරුවන් කපිතාන් නිලයෙහි අධිකාරයට පත්කරනු ලැබේ).

(2) (අ) පිළිගතයුතු විශ්ව විද්‍යාලයක යාන්ත්‍රික ඉංජිනේරු උපාධිය ලත් අය ;

හෝ

(ආ) යාන්ත්‍රික ඉංජිනේරු ආයතනයේ සහකාර සාමාජිකත්වය (ඒ.ඇම්.අයි. මෙක්.ඊ) සඳහා පවත්වනු ලබන විභාගයේ 1වෙනි හා 2 වෙනි කොටස් සාර්ථක ලෙස සම්පූර්ණ කළ අය ;

හෝ

(ඇ) මෝටර් කර්මාන්ත ආයතනයේ සහකාර සාමාජිකත්වය (ඒ. ඇම්.අයි.ඇම්.අයි.) ලැබූ අය.
(ඉහත සඳහන් (2) (අ), (ආ) හෝ (ඇ) වර්ගයන්ගෙන් තෝරාගනු ලබන අයදුම්කරුවන් ලුතිනන් නිලයෙහි අධිකාරයට පත්කරනු ලැබේ).

(3) (අ) කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ සහතිකය සඳහා පාඨමාලාව සම්පූර්ණකළ හෝ ලංකා කාර්මික විද්‍යාලයේ දී ලබාගත් යාන්ත්‍රික ඉංජිනේරු ඩිප්ලොමා සහතික ලත් අයකු හෝ ඊට සමාන සුදුසුකම් ඇති රජයේ හෝ සංයුක්ත මණ්ඩලයක හෝ දෙපාර්තමේන්තුවක හෝ ඕනෑම වර්ගයකට අයත් මෝටර් වාහන සඳහා එකම වෙළඳ නියෝජිත තැනගේ සමාගමෙහි මෝටර් යාන්ත්‍රික ශිල්පයෙහි අඩු තරමින් අවුරුදු 3ක ප්‍රායෝගික පළපුරුද්ද ඇති අයකු;

හෝ

(ආ) ලන්ඩනයේ සිටී ඇන්ඩ් ගිල්ඩ්ස් ආයතනයේ මෝටර් වාහන ශිල්පීන්ගේ සහතිකය ලත් රජයේ හෝ සංයුක්ත මණ්ඩලයක හෝ දෙපාර්තමේන්තුවක හෝ ඕනෑම වර්ගයකට අයත් මෝටර් වාහන සඳහා එකම වෙළඳ නියෝජිත තැනගේ සමාගමෙහි අවුරුදු 3කට නොඅඩු මෝටර් යාන්ත්‍රික ශිල්පයෙහි ප්‍රායෝගික පළපුරුද්ද ඇති අයකු;

හෝ

(ඇ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය ලත් රජයේ හෝ සංයුක්ත මණ්ඩලයක හෝ දෙපාර්තමේන්තුවක හෝ ඕනෑම වර්ගයකට අයත් මෝටර් වාහන සඳහා එකම වෙළඳ නියෝජිත තැනගේ සමාගමෙහි යාන්ත්‍රික හෝ මෝටර් ඉංජිනේරු ශිල්පයෙහි අවුරුදු 5කට නොඅඩු විශේෂ ඇප්‍රෙන්ටිස් පුහුණුවක් ලත් අයකු.

(ඉහත සඳහන් (3) (අ), (ආ) හෝ (ඇ) වර්ගයන්ගෙන් තෝරා ගනු ලබන අයදුම්කරුවන් උප ලුතිනන් නිලයෙහි අධිකාරයට පත්කරනු ලැබේ).

(ඈ) සෞඛ්‍ය තත්ත්වය.—අයදුම්කරුවන් යුද හමුදවට අවශ්‍ය සෞඛ්‍ය තත්ත්වය සපුරාලීමට සුදුසුකම ලබා සිටිය යුතුයි.

5. පහත දක්වා ඇති අන්දමට ඉල්ලුම් පත් තම අත් අකුරෙන් විය යුතු අතර 1965 දෙසැම්බර් 10 වැනි දිනට හෝ ඊට පෙර හමුද මූලස්ථානයට ලැබෙන සේ "යුද හමුද මූලස්ථානය, තැ.පෙ. 553, කොළඹ" යන ලිපිනයට ඉදිරිපත් කළ යුතුයි. ඉල්ලුම් පත බහාලන කවරයෙහි "නිලධාරි තනතුර—ල.වි.යා.ඉ. සඳහා ඉල්ලුම් පත" යනුවෙන් සඳහන් කළ යුතුයි.

6. රජයේ සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ ඉල්ලුම් පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු අතර, යම්කිසි නිලධාරියෙක් තෝරා පත්කර ගනු ලැබුවහොත් ඔහු සේවයෙන් නිදහස් කළ හැකි බවට සහතික කළ යුතුය. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය අඩංගු නොකළහොත් රජයේ විශ්‍රාම වැටුප් හිමි සේවා කාලය හමුද විශ්‍රාම වැටුපට ගණන් ගනු නොලැබේ.

7. පහත සඳහන් ලියකියවිලි වල පිටපත් ඉල්ලුම් පතට අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය ;

(ආ) තමා ලබා ඇති අධ්‍යාපනික සහතිකය/වෘත්තීය සුදුසුකම් පිළිබඳ උසස්ම සහතිකය ;

(ඇ) අඩු ගණනේ චරිත සහතික පත් දෙකක්. මෙම සහතික පත් ඉල්ලුම්කරු පුද්ගලික දන්නා හඳුනන වගකිව යුතු පුද්ගලයන්ගෙන් මෑතදී ලබාගත් ඒවා විය යුතුයි.

8. ලැබෙන ඉල්ලුම් පත් සංඛ්‍යාව ගැන සලකා බලා, අවශ්‍ය වුවහොත් ඉහත සඳහන් සුදුසුකම් ඇති අය අතුරින් මූලික තේරීමක් කරනු ලැබේ. අවසාන තෝරා පත් කර ගැනීම කරනු ලබන්නේ, එසේ තෝරාගත් ඉල්ලුම්කරුවන් ආරක්ෂක ඇමතිතුමා විසින් පත් කරනු ලබන තේරීම් මණ්ඩලයක සම්මුඛ පරීක්ෂණයකට භාජන කිරීමෙන් පසුවය. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගන්නා ඉල්ලුම්කරුවනට එය පවත්වන ස්ථානය, දිනය සහ වේලාවන් ලියා දන්වනු ඇත. සම්මුඛ පරීක්ෂණය කොළඹ පැවැත්වෙන අතර, ඒ සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ අනිකුත් වියදම් රජයෙන් ගෙවනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු නොලබන ඉල්ලුම්කරුවනට ඒ බව දන්වනු ඇත.

9. තෝරා පත්කර ගනු ලබන ඉල්ලුම්කරුවා විසින් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමට සහ විශේෂයෙන්ම, 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කිරීම අරභයා දැනටමත් පනවා ඇති හෝ මින් පසුව පනවනු ලැබිය හැකි නීති රීති වලට අනුකූලව කටයුතු කිරීම අවශ්‍ය වේ.

10. අයදුම් පත දක්වා ඇති පරිදි විය යුතුයි. මෙම මූලස්ථානයේ අයදුම් පත් නිකුත් කරනු නොලැබේ.

ලංකා යුද හමුදවේ ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ නිලධාරී තනතුරු සඳහා ඉල්ලුම්පත්‍රය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ජාතිය :————.
(ලාංකිකයෙකු වූයේ පෙලපතින්ද ? නැතහොත් ලියා පදිංචි කිරීමෙන්ද ? ලියා පදිංචි කිරීමෙන් නම් සහතිකයේ අංකය සහ දිනය සඳහන් කරන්න) :————.

3. ලිපිනය :

කාර්යාලයේ :————.

වාසස්ථානයේ :————.

4. උපන් දිනය :————.

1965 දෙසැම්බර් 10 වැනි දිනට වයස :

අවුරුදු :———මාස :———දින :———

5. සම්පූර්ණ නම, උපන් ස්ථානය, සහ දැන් ලිපිනය :————.

මවගේ :————.

පියාගේ :————.

6. ඔබ විවාහකද ? අවිවාහකද ? :————.

7. පාසැලේ දී හෝ විශ්ව විද්‍යාලයේදී ඔබ ලබා ඇති ක්‍රීඩා ශූරත්වයන් : ———.

8. පාසැලේදී හෝ විශ්ව විද්‍යාලයේදී ඔබ විසින් කීර්තිය ලබා ඇති වෙනත් ක්‍රියාවන් ———.

9. සන්නද්ධ සේවයේ හෝ ස්වේච්ඡා බලසේනාවේ හෝ ශිෂ්‍ය භට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයන්හි හෝ ඔබ ඉහතින් කිනම් සේවයක් කර තිබේද ? '————.

10. මෙම පදවිය ලැබීමට ඔබ සතු වෙනස් විශේෂ සුදුසුකම් මොනවාද ? ————.

11. ඔබ මීට ඉහතින් යම්කිසි සන්නද්ධ සේවයකට බැඳීමට ඉල්ලුම් කෙළෙහි ද, එසේ නම් එහි ප්‍රතිඵලය වූයේ කුමක් ද ? :————.

12. ඔබගේ පාසැල් සමය හෝ විශ්ව විද්‍යාලය සමය පිළිබඳ පහත සඳහන් විස්තර සපයන්න :—

| පාසැලේ හෝ විශ්ව විද්‍යාලයේ නාමය | ඇතුලත් වූ දිනය | අස්වූ දිනය | සමර්ථවූ ප්‍රසිද්ධ පරීක්ෂණය |
|---|---|---|---|
| | | | |

13. පාසැලෙන් හෝ විශ්ව විද්‍යාලයෙන් අස්වූ දින සිට ඔබ නියුක්ත වී සිටි රැකියාවන් පිළිබඳව පහත සඳහන් විස්තර දක්වන්න :—

| ස්වාමි පක්ෂය | රැකියාවේ ස්වභාවය | සේවකය කළ කාලය | |
|---|---|---|---|
| | | දින සිට | දින දක්වා |
| | | | |

14. ඔබට චරිත සහතික දුන් අයගේ නම් සහ ලිපිනයන් :————.

ජේ. ඩී. සොයිසා,
මේජර්,
යුද හමුද ආඥපති වෙනුවට.

1965 නොවැම්බර් මස 16 දින.

————.
ඉල්ලුම්කරුගේ අත්සන

දිනය :————.

11-984—65.12.26 වැනි දින අංක 14,569 දරණ ගැසට් පත්‍රය.

## භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව

### කාර්මික සහකාර තනතුර

භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්මික සහකාර තනතුරක් සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආකෘතියේ ප්‍රකාර පිළියෙල කළ ඉල්ලුම් පත්‍ර 1965 දෙසැම්බර් මස 21 වැනි දින හෝ ඊට ප්‍රථම හෝ ලැබෙන්නට " භූ විද්‍යා සමීක්ෂණ අධ්‍යක්ෂ, භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව, කොළඹ 2 ", යන ලිපිනයට එවිය යුතුයි.

2. වැටුප හා සේවා කොන්දේසි :—

(අ) මෙම තනතුරට අයත් වැටුප් ක්‍රමය අවුරුද්දකට රුපියල් 2,700—120—3,780 දක්වා වේ.

(ආ) තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තෝරා ගත් අපේක්ෂකයා තුන් අවුරුදු පරීක්ෂා කාල සීමාවකට යටත්ව පත් කරනු ඇත.

(ඉ) තෝරාගත් අපේක්ෂකයාට භූ විද්‍යා සමීක්ෂණ අධ්‍යක්ෂ නියම කරනු ලබන පුහුණුවීම් ලබා ගැනීම අවශ්‍ය වනු ඇත.

(ඊ) භාණ්ඩාගාරය සමග සාකච්ඡා කිරීමෙන් පසු තෝරාගත් අපේක්ෂකයාගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව මෙම වැටුප් ක්‍රමයේ එක්තරා ස්ථානයක තබනු ඇත.

3. බඳවා ගැනීමේ කොන්දේසි :—

(අ) තෝරාගත් අපේක්ෂකයා විසින් ඇපයක් තැබීම අවශ්‍ය වනු ඇත.

(ආ) තෝරාගත් අපේක්ෂකයා ලංකාවේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට සූදානම් විය යුතුයි.

4. හැම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) 1965 දෙසැම්බර් 21 වන දිනට වයස අවුරුදු 20 ට නොඅඩු හෝ 35 ට නොවැඩි බව (දැනට රාජ්‍ය සේවයේ නියුක්ත අපේක්ෂකයන් වයස් සීමාවක් ගැන තැකීමක් නැතිව සලකා බලනු ඇත) ;

(ආ) විශිෂ්ට චරිතයෙන් හා යහපත් සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත බව ;

(ඉ) භූ ගර්භ විද්‍යාව සහ භෞතික විද්‍යාව හෝ රසායනික විද්‍යාව යන විෂයයන් සමග පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා ගත්තකු බව හෝ විද්‍යා විෂයයන් තුනක් සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළේ) විභාගයෙන් සමත් හෝ ඊට සමාන වෙනත් සුදුසුකම් ඇති සූක්ෂම කොටස් පිළියෙල කිරීම හා සාමාන්‍ය පාෂාණ විද්‍යා සහ ඛනිජ ක්‍රම පිළිබඳව හෝ සාමාන්‍ය විද්‍යුත සහ විකිරණ මාන රසායනාගාර ක්‍රම ගැන හෝ භූ රසායනික රසායනාගාර ක්‍රමය ගැන හෝ යටත් පිරිසෙයින් පස් අවුරුද්දකවත් පළපුරුද්දක් ඇති බව.

5. නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ නියුක්ත නිලධාරීන්ගේ ඉල්ලුම් පත් එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නියමිත දිනට පෙර ලද බව හා ප්‍රමාදවීම ගැන පිළිගත හැකි කරුණු ඉදිරිපත් කරමින් පිළිගත යුතුයැයි නිර්දේශ නොකරතොත් සලකා බලනු නොලැබේ.

6. අයදුම්පත්වලට :—

(අ) උප්පැන්න සහතික පත්‍රයේද (සැ. යු. :—අධ්‍යාපන රෙගුලාසි පරිදි නිකුත් කරන ලද සහතික හෝ බව්තීස්ම සහතිකය භාර ගනු නොලැබේ) ;

(ආ) උසස්ම අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික පත්‍ර වලද ;

(ඉ) අයදුම්කරුගේ චරිතය, සුදුසුකම් හා මෙම තනතුර සඳහා ඇති යෝග්‍යතාවය පිළිබඳව ළඟදී ලබා ගන්නා ලද සහතික පත්‍ර තුනකද පිටපත් (මුල් පිටපත් නොවේ) අමුණා එවිය යුතුය. (දැනට රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් විසින් (ඉ) හි සඳහන් සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ).

**සැ. යු.—මෙම සහතිකවල පිටපත් ආපසු එවනු නොලැබේ.**

7. අයදුම්කරුවන් නියම කරන ලද දිනකදී සහ වේලාවකදී මෙම කාර්යාලයේ පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීම අවශ්‍ය වනු ඇත. මේ සඳහා ගමන් ගාස්තු හෝ වෙන කිසියම් දීමනාවක් හෝ ගෙවනු නොලැබේ.

8. අයදුම්පත් භූ විද්‍යා සමීක්ෂණ අධ්‍යක්ෂ හැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

9. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරණු ලැබේ.

එල්. ජේ. ඩී. ප්‍රනාන්දු,
භූ විද්‍යා සමීක්ෂණ අධ්‍යක්ෂ.

1965 නොවැම්බර් මස 16 වැනි දින,
කොළඹ 2,
භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුවේදීය.

## කාර්මික සහකාර තනතුර සඳහා අයදුම්පත

### භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.
   (අ) පෙළපත් නම :————.
   (ආ) අනික් නම් :————.

2. ලිපිනය :————.

3. (අ) උපන් දිනය හා ස්ථානය :————.
   (ආ) 1965 දෙසැම්බර් 21 වැනි දිනට වයස :————.

4. ජාතිය :————.

5. (අ) ඉල්ලුම්කරුගේ පියාගේ සම්පූර්ණ නම :————.
   (ආ) ඔහුගේ උපන් දිනය හා ස්ථානය :————.
   (ඉ) ඔහුගේ ජාතිය :————.

6. ඉල්ලුම්කරු විවාහකද, අවිවාහකද, වැන්දඹුද යන බව :————

7. ඉගෙනීම ලත් පාසැල් හා විද්‍යාල ඒවාට ඇතුල්වූ හා අස්වූ දිනයන් සමග :————.
   (අ) පොදු අධ්‍යාපනය සඳහා :————.
   (ආ) වෘත්තීය අධ්‍යාපනය සඳහා :————.

8. අධ්‍යාපන සුදුසුකම් (ලබාගත් උපාධි සහ ඒවා ලබාගත් දින, පන්තිය සහ ඉදිරිපත්වුණු විෂයයන් සඳහන් කරන්න. අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳව ලබා ඇති උසස්ම සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි) :————.

9. ලබා ඇති වෘත්තීය සහ කාර්මික සුදුසුකම් යමක් ඇතොත් දින සමග (පිළිගත් ආයතනවල සාමාජිකත්ව, ලැබූ ඩිප්ලෝමා හෝ වෙනත් සුදුසුකමක් ඇතොත්, ඒවායේ පිටපත් ඇමිණිය යුතුයි) :————.

10. පාසැල හෝ විද්‍යාල හැර යාමෙන් පසු කළ රැකියාවන්, ඒවාට ඇතුල්වූ, අස්වූ දින හා ලැබූ වැටුප් සමග :————.

11. විශේෂ අයිතිවාසිකම්, සුදුසුකම්, පුහුණුවීම් හෝ පළපුරුදුකම් :————.

12. ඔබ ගැන කරුණු දැන ගැනීමට හැකි අයවලුන් තිදෙනකුගේ නම් හා නිලතල :————.

13. චරිත සහතික ඉදිරිපත් කර ඇති සම්භාවනීය පුද්ගලයින් තිදෙනාගේ නම් හා නිලතල :————.

මෙහි සඳහන් කර ඇති යම් කරුණක් වැරදි හෝ අසත්‍ය බව හෝ පත්වීම් දෙන්නට පෙර හෙළිවන්නට යෙදුණොත්, මගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමටත්, පත්වීම ලැබුවාට පසු හෙළි වුවහොත් කිසිම වන්දි ගෙවීමක් නැතිව මා නිලයෙන් අස් කිරීමටත් යටත් වන බව දැනගෙන සිටින බවද, මේ අයදුම් පතෙහි දැක්වෙන සියළු විස්තර සත්‍ය හා නිවැරදි බවද මෙයින් සහතික කරමි.

————,
අත්සන.

ස්ථානය :————.

දිනය :————.

11–1066—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය

## ජාතික පේෂකර්ම සංස්ථාව

වර්ෂ 1965ක් වූ දෙසැම්බර් මස 3 වෙනි දින ප. ව. 4.30 දක්වා පහත සඳහන් තනතුරු සඳහා ලාංකිකයින්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

වැඩමුර සහකාර තනතුරු (වාෂ්ප සහ විදුලි බල යන්ත්‍ර)

සුදුසුකම් :

(i) ඉංජිනේරු විද්‍යාමධ්‍ය පරීක්ෂණය සහ කණිෂ්ඨ කාර්මික නිලධාරි පරීක්ෂණය හෝ සමාන සුදුසුකමක් ද,

(ii) වාෂ්ප සහ විදුලි බල යන්ත්‍ර ක්‍රියාකරවීම හා නඩත්තු කිරීම ගැන අඩුම ගණනේ අවුරුදු 5ක පළපුරුද්ද,

(iii) පළමු පෙළ බොයිලේරු යන්ත්‍ර ක්‍රියාකරවන්නන්ගේ සහතිකය.

(iv) වයස—අවුරුදු 35ට අඩුවිය යුතුයි.

සුදුසුකම් හා පළපුරුද්ද අනුව වැටුප් ගෙවනු ලැබේ.

අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ වයස, අධ්‍යාපනික සුදුසුකම් හා පාසැලෙන් අස්වූ පසු කළ රැකියාවන් යනාදිය පිළිබඳ සම්පූර්ණ විස්තරද සඳහන් කළයුතු අතර, අධ්‍යාපනික සහ චරිත සහතිකයන්ගේ පිටපතද (මුල් පිටපත් නොවේ) ඉදිරිපත් කළ යුතුය.

ආධාර ලබාගැනීමට හෝ අසත්‍ය තොරතුරු සැපයීමට උත්සාහ කිරීම නුසුදුසුකමක් හැටියට සලකනු ලැබේ.

සභාපති.

ජාතික පේෂකර්ම සංස්ථාව,
56, හෝර්ටන් පෙදෙස,
කොළඹ 7.

11-1014—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය

---

## ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය

ගණක ලිපිකරු ආබෑසියන් ලෙස සේවයෙහි යෙදවීම සඳහා ලාංකිකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් 66.1.1. දිනට වයස අවුරුදු 20 ට වැඩිවූ ද අවුරුදු 25 ට අඩුවූ ද අය වියයුතු අතර පහත සඳහන් විෂයයන්ගෙන් එක් වර ලත් සාමාර්ථය සැයි තව ත්‍රෛමාධ්‍යයන්ගෙන් කවරෙකින් වුවද පො.ස.වි. (සාමාන්‍ය) හෝ ජ්‍යෙ.පා.ස. යෙන් සාමාර්ථය ලැබුවන් විය යුතුය :—

ගණිතය හෝ අංක ගණිතය.
පොත් තැබීම.
ඉංග්‍රීසි.

ගණන් තැබීමෙහි පළපුරුද්ද වාසියකි.

තෝරාගනු ලැබූ අයදුම්කරුවන් රු. 1,200—72—1,920 වැටුප් පරිමාණයෙහි තබනු ලබන අතර ලංකාවේ කවර ප්‍රදේශයක වුවද ස්ථාන ගත කරනු ලැබේ.

යථෝක්ත වැටුප් සමග රජයේ ගාස්තු අනුව තාවකාලික ජීවන වියදම් ගෙවනු ලබන අතර, නිවාස සපයා නැත්නම් විවාහකයකුට වැටුපෙන් 15% බැගින් ද අවිවාහකයෙකුට වැටුපෙන් $7\frac{1}{2}$% බැගින්ද නිවාස කුලී දීමනා ගෙවනු ලැබේ. අර්ථ සාධක අරමුදල් පහසුකම් ද දෙනු ලැබේ.

අයදුම් කිරීමට බලාපොරොත්තුවන අය විසින් පහත අත්සන් කර ඇති අය වෙත ස්වකීය ලිපිනය හා මුද්දර සහිත කවරයක් සමග ලියා හෝ තමන් විසින් ම පැමිණ නියමිත ආකෘති පත්‍රය ලබාගත හැක. කවරේ ඉහත වම් පසෙහි අයදුම් කරනු ලබන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

තෝරා ගනු ලැබූ අයදුම්කරුවන් විසින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය අනුව සිංහල පිළිබඳ සුදුසුකම් ලබාගත යුතුය.

අයදුම් පත් භාරගන්නා අවසාන දිනය 65.12.15 වේ.

පාලක ලේකම්,
ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය.

ආ. පෙ. 524,
415, බුලර්ස් පාර,
කොළඹ 7.

11-1098—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය

---

## ගුවන් විදුලි හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

### ඉංග්‍රීසි කොන්ත්‍රාත් නිලධාරිනු (වනිතා)

ගුවන් විදුලි හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ වෙළඳ සේවයේ ඉංග්‍රීසි කොන්ත්‍රාත් නිලධාරිනු (වනිතා) සඳහා මෙයින් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙම දැන්වීම කෙළවර දැක්වෙන ආදර්ශ ආකෘතියේ ආකාරයට සැපයිය යුතු ඉල්ලුම්පත් 1965 දෙසැම්බර් 11 වැනි දිනට ප්‍රථම ලැබෙන සේ කොළඹ 7, ටොරිංටන් චතුරශ්‍රයේ ගුවන් විදුලි හා ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙතට තැපෑලෙන් එවිය යුතුය. ලිපි කවරයේ ඉහළ වම් කෙළවර 'ඉංග්‍රීසි කොන්ත්‍රාත් නිලධාරිනු (වනිතා)' යන්න පැහැදිලිව ලිවිය යුතුයි.

2. ගෙවනු ලබන පාරිශ්‍රමිකය වැඩ කරන දිනකට රු. 10 බැගිනි. වෙනත් දීමනා කිසිත් ගෙවනු නොලැබේ.

3. (1) අයදුම්කරුවන් 1965 දෙසැම්බර් 11 වැනි දිනට වයසින් අවුරුදු 21ට නොඅඩු ලාංකිකයින් වියයුතු අතර යටත් පිරිසෙයින් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් සාමාර්ථය ලබා සිටිය යුතුයි. ඉංග්‍රීසි වාග් චාතුර්යයද සිංහලෙන් හා/හෝ දෙමළෙන් කටයුතු කිරීමේ හැකියාවක්ද ඇතිවීම අවශ්‍යය. බටහිර සංගීතය පිළිබඳ දැනුම වැඩි සුදුසුකමක් සේ සැළකේ.

(2) පස්වරු 1 සිට පස්වරු 3 දක්වා සියළු වනිතා වැඩ සටහන් සකස් කිරීම, නිෂ්පාදනය කිරීම හා ඉදිරිපත් කිරීමද, විටින් විට නියම කරනු ලබන වේලාවන් තුළ වෙළඳ දැන්වීම් පටිගත කිරීමද තෝරා පත්කර ගනු ලබන අයදුම්කරුවන් වෙත පැවරෙන කාර්යයවේ.

4. ඉල්ලුම්කරුවන් විසින් පහත සඳහන් ලියවිලිවල පිටපත් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි :—

(i) ඉහළම අධ්‍යාපනික සුදුසුකම් දැක්වෙන සහතිකය.

(ii) අයදුම්කරුගේ චරිතය, කාර්ය ශූරත්වය, සුදුසුකම් හා තනතුරට පත් කිරීමේ යෝග්‍යත්වය දැක්වෙන මෑතකදී ලබාගත් සහතික දෙකක් (රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ගෙන් මේ උපජේදය යටතේ සහතික අනවශ්‍යය.)

සැලකිය යුතුයි.—මේ සහතික පිටපත් අයදුම්කරුවන් වෙත ආපසු එවනු නොලැබේ. මුල් ලියවිලි ඉදිරිපත් කළ යුත්තේ සම්මුඛ පරීක්ෂණයකට කැඳවූවහොත් හා එවිටය.

5. ඉල්ලුම්පත් හෝ ඒ පිළිබඳ සෙසු ලියවිලි හෝ එවිය යුත්තේ ගුවන් විදුලි හා ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙතට මිස මෙම දෙපාර්තමේන්තුවේ යම්කිසි නිලධාරියකුගේ පුද්ගලික ලිපිනයට නොවේ.

6. ඉල්ලුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

වින්සන්ට් පණ්ඩිත,
වැඩබලන ගුවන් විදුලි හා ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්.

1965 නොවැම්බර් 18වැනි දින,
කොළඹ 7.

### ඉල්ලුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය

ඉංග්‍රීසි කොන්ත්‍රාත් නිලධාරිනු—(වනිතා)

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන් ලියන්න) :———.
   (අ) වාසගම හෙවත් අගට යෙදෙන නම :———.
   (ආ) සෙසු නම් :———.
2. ස්ථිර ලිපිනය :———.
3. 1965 දෙසැම්බර් මස 11 දිනට නියම වයස :—
   අවුරුදු :———, මාස :———, දින :———.
4. ජාතිය :—
   (i) ලාංකිකත්වය ලියාපදිංචි කිරීමෙන්ද පරම්පරාවෙන්ද යන වග :———.
   (ii) ලාංකිකත්වය පාරම්පරිකව නම් යට සඳහන් අය උපන් ස්ථාන සඳහන් කරන්න :———.
      (අ) අයදුම්කරු :———.
      (ආ) අයදුම්කරුගේ පියා :———.
      (ඉ) අයදුම්කරුගේ පියාගේ පියා :———.
      (ඊ) අයදුම්කරුගේ පියාගේ පියාගේ පියා :———.
5. අධ්‍යාපනික සුදුසුකම් :—
   (අ) සිංහල භාෂාව පිළිබඳ ලබා ඇති දැනුම ———.
   (ආ) දෙමළ භාෂාව පිළිබඳ ලබා ඇති දැනුම :———.
   (ඇ) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ලබා ඇති දැනුම :———.
6. සංගීතය පිළිබඳ දැනුම :———.
7. මීට අමුනා ඇති චරිත සහතික ලබාගත් අයගේ නම් හා ලිපින :———.
8. රජයේ සේවයේ කිසි කලෙක යෙදී සිටියේ නම් ඒ කවදාද කොතැනකද යනවග (ඒ ඒ දෙපාර්තමේන්තුවල සේවය කළ කාලය වෙන් වශයෙන් දැක්විය යුතුයි) :———.

———,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :———.

11-1032—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ජාතික ලුණු සංස්ථාව

### කළුගල් සැපයීම

හම්බන්තොට මහ ලේවාය අසලදී ලොකු කලුගල් කුට්ටි 1,200ක් සහ කැටගල් ටොන් 1,200ක් පමණ සැපයීම සඳහා ටෙන්ඩර් 1965 දෙසැම්බර් මස 10 වැනිදා තෙක් භාරගනු ලැබේ.

වැඩි විස්තර හම්බන්තොට, ජාතික ලුණු සංස්ථාවේ සාමාන්‍යාධිකාරි තැනගෙන් ලබාගත හැක.

ලේකම්.

110, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත,
කොළඹ 2,
1965 නොවැම්බර් මස 22 දින.

11-1113—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය

---

## ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

කොළඹ යෝක් වීදියේ, "ලක්සලේ" වහල අළුත්වැඩියා කිරීම සඳහා ස්වදේශ කටයුතු භාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 65.12.22 දින පෙරවරු 9.30 දක්වා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

2. පහත සඳහන් දෙපාර්තමේන්තුවක රු. 30,000කට හෝ ඊට වැඩි ගොඩනැගිලි වැඩ සඳහා හෝ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවනට මෙයට සහභාගි විය හැක:—

(අ) රජයේ වැඩ දෙපාර්තමේන්තුව,
(ආ) වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
(ඇ) අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
(ඈ) දුම්රිය දෙපාර්තමේන්තුව.

3. මෙයට සහභාගිවීමට කැමති කොන්ත්‍රාත්කරුවන් විසින් රු. 25 ක ආප මුදලක් මේ කාර්යාලයේ හෝ කොළඹින් පිට කච්චේරියක හෝ තැන්පත් කර 65.12.18 දින දහවල් 12ට ප්‍රථම කුවිතාන්සිය ඉදිරිපත් කර ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගත යුතු ය.

4. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේ දී ටෙන්ඩර්කරුවනට පැමිණිය හැක. ටෙන්ඩර් විවෘත කරනු ලබන්නේ 65.12.22 දින පෙ. ව. 9.30 ට ස්වදේශ කටයුතු භාර අමාත්‍යාංශයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමාගේ කාර්යාලයේ දී ය.

පී. එච්. පී. ද සිල්වා,
ග්‍රාමසංවර්ධන සහ කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

1965 නොවැම්බර් මස 22 වැනි දින,
කොළඹ 7, ටොරිංටන් චතුරශ්‍රයේ දී ය.

11-1128—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය

---

## මුද්‍රණ ලෝහ මණ්ඩි (Metal Dross) මිලයට ගැනීම සහ ඉවත් කර ගැනීම

ආණ්ඩුවේ මුද්‍රණාලයේ දළ වශයෙන් ටොන් 10ක් පමණ ඇති මුද්‍රණ ලෝහ මණ්ඩි මිලයට ගැනීම සහ ඉවත් කර ගැනීම සඳහා මුද්‍රා තබා රෙජිස්ටර් තැපැලෙන් එවනු ලබන ටෙන්ඩර් කොළඹ, බොරැල්ලේ ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් 1965 දෙසැම්බර් 15 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 දක්වා, භාරගනු ලැබේ. ටෙන්ඩර් බහා දූ මුද්‍රා කරන ලද කවරයේ වම් කෙළවරේ උඩ "මුද්‍රණ ලෝහ මණ්ඩි මිලයට ගැනීම සහ ඉවත් කරගැනීම" යන්න ලියා තිබිය යුතුය. රෙජිස්ටර් තැපැලෙන් නොඑවන ටෙන්ඩර් ආණ්ඩුවේ මුද්‍රණාලයේ ප්‍රධාන කාර්‍යාලයේ ඒ සඳහා තබා ඇති පෙට්ටියට බහාලිය යුතු ය.

2. බොරැල්ලේ, ආණ්ඩුවේ මුද්‍රණාලයෙන් භාරගන්නා ටොන් එකක මිළ වශයෙන් සඳහන් කළ යුතුය.

3. ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 50ක් කොළඹ, බොරැල්ලේ ආණ්ඩුවේ මුද්‍රණාලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ආකෘතිපත්‍ර නිකුත් කරනු ඇත.

4. 1965 දෙසැම්බර් 13 වැනි සඳුදා දවල් 12 දක්වා ටෙන්ඩර් ආකෘතිපත්‍ර නිකුත් කරනු ලැබේ.

5. ලෝහවල ආදර්ශයන් සෙනසුරාදා දිනයන් හැර සතියේ කවර දිනක හෝ පෙරවරු 9 සිට පස්වරු 4 දක්වා මේ දෙපාර්තමේන්තුවේදී බැලිය හැක.

6. වැඩිම මිල ගණන සඳහන් වන ටෙන්ඩරය භාරගැනීමේ අයිතිය ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති සතුවනවා ඇත.

7. ටෙන්ඩර් පත්‍ර 1965 දෙසැම්බර් 14 වැනි දින පෙරවරු 9.30ට කොළඹ, බොරැල්ලේ ආණ්ඩුවේ මුද්‍රණාලයේ ප්‍රධාන කාර්‍යාලයේදී විවෘත කරන විට, ටෙන්ඩර් පත්‍රකරුවන්ට පෙනී සිටීමට අවසර දෙනු ඇත.

8. නො පිළිගන්නා ටෙන්ඩර් පත්‍රවල තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

9. ටෙන්ඩරය පිළිගත් බව දන්වූ දින සිට දින හතක් ඇතුළතදී මුළු මුදල ගෙවා ද්‍රව්‍යයන් ඉවත්කර ගැනීමට ජයග්‍රාහක ටෙන්ඩර්කරු අපොහොසත් වුවහොත් ටෙන්ඩර් තැන්පත් මුදල කිසිම හිමිකමක් නොලැබෙන පරිදි රාජසන්තක කරනු ඇත.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1965 නොවැම්බර් 22 වැනි දින,
කොළඹ, ආණ්ඩුවේ මුද්‍රණාලයේදී ය.

11-1057/1—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය

---

## තුත්තනාගම් ලයිනිං මිලයට ගැනීම සහ ඉවත් කර ගැනීම

බොරැල්ලේ ආණ්ඩුවේ මුද්‍රණාලයේ තිබෙන, තුත්තනාගම් ලයිනිං තොගයක් මිලයට ගැනීම සහ ඉවත් කර ගැනීම සඳහා, කවරයෙහි උඩ වම් කොනෙහි "තුත්තනාගම් ලයිනිං මිලයට ගැනීම සඳහා ටෙන්ඩරය" යන්න ලියා රෙජිස්ටර් තැපැලෙන් එවනු ලබන සිල් කරන ලද ටෙන්ඩර් 1965 දෙසැම්බර් 14 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 වන තුරු කොළඹ බොරැල්ලේ ආණ්ඩුවේ මුද්‍රණාලයේ, ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් භාරගනු ලැබේ. රෙජිස්ටර් තැපැලෙන් නොඑවන ටෙන්ඩර්, ආණ්ඩුවේ මුද්‍රණාලයේ ප්‍රධාන කාර්‍යාලයෙහි ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතුය.

2. බොරැල්ලේ ආණ්ඩුවේ මුද්‍රණාලයේ දී භාරගැනීම පිණිස, තුත්තනාගම් ලයිනිං සඳහා රාත්තලකට මිල ගණන් ඉදිරිපත් කළ යුතුය.

3. බොරැල්ලේ, ආණ්ඩුවේ මුද්‍රණාලයෙහි රුපියල් පණහක් තැන්පත් කර ලබා ගන්නා ලද කුවිතාන්සියක්, ටෙන්ඩර් පෝරම ලබාගැනීමේදී ඉදිරිපත් කළ යුතුය.,

4. 1965 දෙසැම්බර් 13 වැනි දින දවල් 12 වන තුරු ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ.

5. සෙනසුරාද දිනවල හැර, සතියේ ඕනෑම දිනක පෙරවරු 9 සිට පස්වරු 4 දක්වා මෙම දෙපාර්තමේන්තුවේදී මේ ද්‍රව්‍ය බැලිය හැක.

6. වැඩිම මිළ ගණන ඉදිරිපත්කර ඇති ටෙන්ඩරය පිළිගැනීමේ අයිතිය ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත පැවරී ඇත.

7. කොළඹ, බොරැල්ලේ ආණ්ඩුවේ මුද්‍රණාලයේ ප්‍රධාන කාර්යාලයේදී 1965 දෙසැම්බර් 14 වැනි දින පෙරවරු 9.30ට ටෙන්ඩර් විවෘත කරනු ලබන විට ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට ඉඩ දෙනු ලැබේ.

8. නොපිළිගනු ලබන ටෙන්ඩරයක් වුවොත් ඒ සඳහා වූ තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ.

9. ටෙන්ඩරය පිළිගනු ලැබූ බව දැන්වූ දින සිට දින හතක් ඇතුළත සම්පූර්ණ වටිනාකම ගෙවා ද්‍රව්‍ය ඉවත් කර ගැනීමට ටෙන්ඩරය ලබාගත් අය අපොහොසත් වුවහොත්, කිසිම අයිතිවාසිකමක් නොමැතිව ටෙන්ඩරය සඳහා වූ තැන්පත් මුදල රාජසන්තක කරනු ලැබේ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1965 නොවැම්බර් මස 22 දින,
කොළඹ, ආණ්ඩුවේ මුද්‍රණාලයේ දී ය.

11-1057/2—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

මින්නාරම උප කොට්ඨාශයේ යෝධ වැවේ වේල්ලේ පස් වැඩ සඳහා ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් අයදුම්පත්, කොළඹ තැ. පෙ. අංක 500, මහා ලේකම් ගොඩනැගිල්ලේ අංක 355 දරණ කාමරයෙහි ඉඩම්, වාරිමාර්ග හා විදුලිය පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1965 දෙසැම්බර් මස 21 වෙනි කුජ දින පූර්වභාග 10.00 වන තෙක් භාරගනු ලැබේ. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 1,00,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි වූ පස් වැඩ කිරීමට යෝග්‍ය යන්ත්‍ර ඇති කොන්ත්‍රාත්කරුවනට පමණක් මේ වැඩය සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැක.

වවුනියාවේ උතුරු කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබාගත් ටෙන්ඩර් පෝර්ම, අනුපිටපතක් සමග පුරවා ඉදිරිපත් කළ යුතුය.

රුපියල් 200 ක ටෙන්ඩර් ඇප මුදලක් වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලයේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් කාර්යාලයීය වේලාවන් තුළ 1965 දෙසැම්බර් මස 17 වෙනි කිවි දින හෝ ඊට පෙර ටෙන්ඩර් පෝර්ම ලබා ගත හැක. මේ ගැන වැඩි විස්තර වවුනියාවේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

ඩී. ජේ. රාමනායක,
වාරිමාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

1965 නොවැම්බර් මස 20 වැනි දින,
කොළඹදී ය.

11-1010—65.11.26 දින අංක 14,569 දරණ ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### මහකනදරාව උප කොටස

මහකනදරාව උ: කො: යටතේ පහත සඳහන් වැඩ වෙනුවෙන් ටෙන්ඩර් අයදුම්පත් 1965 දෙසැම්බර් 21 වැනි දින පෙරවරු 11 වන තෙක් අනුරාධපුර උතුරු මැද කොටසෙ, ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාර ගෙන එවේලේම විවෘත කරනු ඇත.

(1) මහකනදරාව ව්‍යාපාරයේ දකුණු ඉවුරේ ප්‍රධාන ඇලේ සැ. 6 දම්. 20 සිට සැ. 7 සහ

(2) සැ. 7 සිට සැ. 7 දම්. 27 දක්වා නිර්මාන කිරීම.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 48,000 සහ රු. 22,000 කට පිළිවලින් එක් එක් වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ට, සමූපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩ සඳහා ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත් කළ හැකිය.

3. 1965 දෙසැම්බර් මස 17 වැනි සිකුරාදා සවස 4.30 දක්වා කාර්යාලීය වේලාවන්හි මහකනදරාව, අනුරාධපුර සහ පදවිය උප කොටස්වල වාරිමාර්ග ඉන්ජිනේරුන්ගේ කාර්යාලවලින් ටෙන්ඩර් ඉල්ලුම්පත් ලබා ගත හැක. ටෙන්ඩර් ඉල්ලුම්පත් ලබා ගැනීමේදී ඒ සඳහා ඉදිරිපත් වන කොන්ත්‍රාත්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් රජය යටතේ කරන වැඩ සහ ඒවායේ වටිනාකම් දැක්වෙන සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි. ආකෘති පත්‍ර නිකුත් කිරීමට ප්‍රථම රු. 50 ක් එක් එක් ටෙන්ඩරයක් වෙනුවෙන්, ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉන්ජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි.

4. මේ ටෙන්ඩර් ගැන සියලුම විස්තර කාර්යාලීය වේලාවන්හි දී මහකනදරාව උප කොටසේ වාරිමාර්ග ඉන්ජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

ක. තනගසුංදරම්,
වාරිමාර්ග ඉන්ජිනේරු තැන,
මහකනදරාව, උ. කො.

1965 නොවැම්බර් මස 12 වැනි දින,
මිහින්තලේ දිය.

11-780—65.11.26 දින අංක 14,569 දරණ ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### කල්මුනේ උප කොට්ඨාශය

මඩකලපුව දුම්රිය ගබඩාවේ සිට අම්පාර දිස්ත්‍රික්කයේ කල්මුනේ උප කොට්ඨාශයේ වාරිමාර්ග බඩු ගබඩාව දක්වා බඩු ප්‍රවාහනය කිරීම සඳහා ටෙන්ඩර්පත් 1965 දෙසැම්බර් මාසයේ 21 වෙනි අඟහරුවාදා පෙරවරු 10 දක්වා මඩකලපුව නැගෙනහිර කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එදිනම පෙරවරු 10.30 ට එම ස්ථානයේදීම සිදු කෙරේ.

2. මෙම කොන්ත්‍රාත්තුව රුපියල් 10,000 කට ලියාපදිංචි කර ඇත. 1965 දෙසැම්බර් මාසයේ 17 වෙනි සිකුරාදා දහවල් 12 දක්වා (එදින ඇතුළුව) කාර්යාල වේලාවන් තුළදී කල්මුනේ, අම්පාරේ, චෙන්කලඩි හා ප්‍රා. වා. ඉංජිනේරු කාර්යාලය මඩකලපුවෙන් ලබාගත හැකි පෝර්මවල ටෙන්ඩර් අයදුම්පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි, පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශනයක්, ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීමට වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝර්ම නිකුත් කිරීමට ප්‍රථම රු. 25 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් කල්මුනේ, අම්පාරේ, චෙන්කලඩි, මඩකලපුව යන ඉංජිනේරු කාර්යාලවලදී හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය.

3. වැඩිපුර විස්තර කාර්යාල කාලය තුළදී, කල්මුනේ උප කොට්ඨාශයෙන් ලබාගත හැකිය.

එස්. සභාරත්නම්,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
කල්මුනේ උප කොට්ඨාශය.

1965 නොවැම්බර් මස 18 වැනි දින,
වාරිමාර්ග කාර්යාලය,
කල්මුනේ.

11-1031—65.11.26 දින අංක 14,569 දරණ ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—රාජාංගන ව්‍යාපාරය

රාජාංගන ව්‍යාපාරයට පිවිසෙන පාරේ අග සිට අනුරාධපුර-පුත්තලම් පාරට යාවෙන පාරේ 8 වන සැතපුම, සක්කගල් අල්ලා කුඩා ගල් දමා තාර දැමීම (ටෙන්ඩර් අංක ආර්. එල්. 9) සඳහා ටෙන්ඩර් පත් 1965.12.21 වෙනි දින පෙ. ව. 10 දක්වා භාර ගනු ලැබේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 40,000කට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්වරුන්ට, සමූපකාර සමිතිවලට සහ ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩ සඳහා ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ හැක.

3. 1965.12.17 වැනි දින තෙක් (එදින ඇතුලුව) කාර්යාලීය වේලාවන් තුලදී පහත සඳහන් වාරිමාර්ග කාර්යාලයන්හි ඉංජිනේරු මහතුන්ගෙන් ලබාගත හැකි පෝරම්වල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුයි :—

(1) කුරුණෑගල (2) පුත්තලම

ටෙන්ඩර් පෝරම ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද ? නැද්ද ? යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝරම නිකුත් කිරීමට ප්‍රථම රු. 50ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මේ ටෙන්ඩරය ගැන සියලුම වැඩි විස්තර, හිවිසුම්, වැඩය පිළිබඳ සැලසුම්, විශේෂ විස්තර යනාදිය කාර්යාලීය වේලාවන් තුලදී ඉහත සඳහන් වාරිමාර්ග ඉංජිනේරු තුමන්ගෙන් ලබාගත හැක.

කේ. බී. ඊ. ද ඇස්. කරුණාරත්න,
වාරිමාර්ග ඉංජිනේරු—රාජාංගන ව්‍යාපාරය.

වාරිමාර්ග කාර්යාලය,
රාජාංගන ව්‍යාපාරය, තඹුත්තේගම,
1965.11.17 වැනි දින.

11-1033/1—65.11.26 දින අංක 14,569 දරණ ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—රාජාංගන ව්‍යාපාරය

රාජාංගන ව්‍යාපාරයට පිවිසෙන පාරේ අග සිට අනුරාධපුර-පුත්තලම් පාරට යාවෙන පාරේ 9 වන සැතපුම, සක්කගල් අල්ලා කුඩාගල් දමා තාර දැමීම (ටෙන්ඩර් අංක ආර්. ඇල්. 10) සඳහා ටෙන්ඩර් පත් 1965.12.21 වෙනි දින පෙ. ව. 10 දක්වා බාර ගනු ලැබේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 40,000කට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට, සමුපකාර සමිතිවලට සහ ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩ සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැක.

3. 1965.12.17 වැනි දින තෙක් (එදින ඇතුලුව) කායාලීය වේලාවන් තුලදී පහත සඳහන් වාරිමාර්ග කායාලයන්හි ඉංජිනේරු මහතුන්ගෙන් ලබාගත හැකි පෝරම්වල ටෙන්ඩර් අයදුම් පත් සකස් කල යුතුයි :—

1. කුරුණෑගල 2. පුත්තලම්

ටෙන්ඩර් පෝරම ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද? නැද්ද? යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝරම නිකුත් කිරීමට ප්‍රථම රු. 50ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායාලයේ හෝ මිනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මේ ටෙන්ඩරය ගැන සියලුම වැඩි විස්තර, ගිවිසුම්, වැඩය පිළිබඳ සැලසුම්, විශේෂ විස්තර යනාදිය කායාලීය වේලාවන් තුලදී ඉහත සඳහන් වාරිමාර්ග ඉංජිනේරු තුමන්ගෙන් ලබාගත හැක.

කේ. බී. ඊ. ද ඇස්. කරුණාරත්න,
වාරිමාර්ග ඉංජිනේරු—රාජාංගන ව්‍යාපාරය, ද.ඉ.

වාරිමාර්ග කායාලය,
රාජාංගන ව්‍යාපාරය, තඹුත්තේගම,
1965.11.17 වැනි දින.

11–1033/2—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—රාජාංගන ව්‍යාපාරය

රාජාංගන ව්‍යාපාරයට පිවිසෙන පාරේ අග සිට අනුරාධපුර-පුත්තලම් පාරට යාවෙන පාරේ 10 වන සැතපුම, සක්කගල් අල්ලා කුඩාගල් දමා තාර දැමීම (ටෙන්ඩර් අංක ආර්. එල්. 11) සඳහා ටෙන්ඩර් පත් 1965.12.21 වෙනි දින පෙ. ව. 10 දක්වා බාර ගනු ලැබේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 40,000කට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට, සමුපකාර සමිතිවලට සහ ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩ සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැක.

3. 1965.12.17 වැනි දින තෙක් (එදින ඇතුලුව) කායාලීය වේලාවන් තුලදී පහත සඳහන් වාරිමාර්ග කායාලයන්හි ඉංජිනේරු මහතුන්ගෙන් ලබාගත හැකි පෝරම්වල ටෙන්ඩර් අයදුම් පත් සකස් කල යුතුයි :—

(1) කුරුණෑගල (2) පුත්තලම

ටෙන්ඩර් පෝරම ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද? නැද්ද? යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝරම නිකුත් කිරීමට ප්‍රථම රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායාලයේ හෝ මිනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මේ ටෙන්ඩරය ගැන සියලුම වැඩි විස්තර, ගිවිසුම්, වැඩය පිළිබඳ සැලසුම්, විශේෂ විස්තර යනාදිය කායාලීය වේලාවන් තුලදී ඉහත සඳහන් වාරිමාර්ග ඉංජිනේරු තුමන්ගෙන් ලබාගත හැක.

කේ. බී. ඊ. ද ඇස්. කරුණාරත්න,
වාරිමාර්ග ඉංජිනේරු—රාජාංගන ව්‍යාපාරය, ද.ඉ.

වාරිමාර්ග කායාලය,
රාජාංගන ව්‍යාපාරය, තඹුත්තේගම,
1965.11.17 වැනි දින.

11–1033/3—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—රාජාංගන ව්‍යාපාරය

රාජාංගන ව්‍යාපාරයට පිවිසෙන පාරේ අග සිට අනුරාධපුර-පුත්තලම් පාරට යාවෙන පාරේ 11 වන සැතපුම, සක්ක ගල් අල්ලා කුඩාගල් දමා තාර දැමීම (ටෙන්ඩර් අංක ආර්. එල්. 12) සඳහා ටෙන්ඩර් පත් 1965.12.21 වෙනි දින පෙ. ව. 10 දක්වා බාර ගනු ලැබේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 40,000කට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට, සමුපකාර සමිතිවලට සහ ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩ සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැක.

3. 1965.12.17 වැනි දින තෙක් (එදින ඇතුලුව) කායාලීය වේලාවන් තුලදී පහත සඳහන් වාරිමාර්ග කායාලයන්හි ඉංජිනේරු මහතුන්ගෙන් ලබාගත හැකි පෝරම්වල ටෙන්ඩර් අයදුම් පත් සකස් කල යුතුයි :—

(1) කුරුණෑගල (2) පුත්තලම

ටෙන්ඩර් පෝරම ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද? නැද්ද? යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝරම නිකුත් කිරීමට ප්‍රථම රු. 50ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායාලයේ හෝ මිනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මෙ ටෙන්ඩරය ගැන සියලුම වැඩි විස්තර, ගිවිසුම්, වැඩය පිළිබඳ සැලසුම්, විශේෂ විස්තර යනාදිය කායාලීය වේලාවන් තුලදී ඉහත සඳහන් වාරිමාර්ග ඉංජිනේරු තුමන්ගෙන් ලබාගත හැක.

කේ. බී. ඊ. ද ඇස්. කරුණාරත්න,
වාරිමාර්ග ඉංජිනේරු—රාජාංගන ව්‍යාපාරය, ද.ඉ.

වාරිමාර්ග කායාලය,
රාජාංගන ව්‍යාපාරය, තඹුත්තේගම,
1965.11.17 වැනි දින.

11–1033/4—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය.

---

## පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

පැවිච්චි කළ නොහැකි ඒ. ජී. ඒ. උදුනක් විකිණීම සඳහා 1965.12.20 දින දවල් 12 දක්වා පරිවාස සහ ළමාරක්ෂක සේවා කොමසාරිස් තැන විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ. පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර්පත් සීල් තැබූ කවරයක් තුල බහා එහි උඩ වම් කෙළවර "ඒ.ජී.ඒ. උදුන සඳහා ටෙන්ඩරය" යනුවෙන් සඳහන් කොට ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතුය. එම උදුන කාර්යාලීය වේලාවලදී මෙම කාර්යාලයේදී පරීක්ෂා කර බැලිය හැක.

ටෙන්ඩර් තැන්පත් මුදල රුපියල් 50 කි.

ආර්. ජී. ජී. ඕ. ගුණසේකර,
පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් තැන.

අංක 3, ඕගතලේ පාර,
කොළඹ 3, 1965.11.22.

11–1129—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය.

## රජයේ විදුලි දෙපාර්තමේන්තුව

### ආරක්ෂිත ඒරියල් බහන් සහ නිවාස වලට විදුලිය සැපයීමේ

### ඊඹු බහන් සැපයීම

1965.10.29 දින දරණ රජයේ ගැසට් නිවේදනය සම්බන්ධව, ඉහත සඳහන් ටෙන්ඩර් පත් භාර ගන්නා දිනය 1965.12.28 දින පූ. භා. 10 දක්වා දීර්ඝ කර ඇති බව ටෙන්ඩර්කරුවන් වෙත මෙසින් අනුම් දෙනු ලැබේ. ටෙන්ඩර් පොත් 1965.12.24 දින අ. භා. 2 දක්වා නිකුත් කරනු ලැබේ.

ආර්. ඩබ්ලිව්. පීරිස්,
වැ.බ. විදුලි කර්මාන්ත ප්‍රධාන කළමනාකරු වෙනුවට.

තැ. පෙ. 540,
කොළඹ,
1965.11.26.

11-1065—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය.

---

## ආහාර දෙපාර්තමේන්තුව

කිරුම් පාලම් පිකට් පත්‍ර 1,00,000 ක් (පිටපත් දෙකකින් යුතුව) මුද්‍රණය කිරීම සඳහා ටෙන්ඩර්පත්‍ර 1965 දෙසැම්බර් මස 14 වැනි අඟහරුවාදා පස්වරු 2.30 දක්වා කොළඹ, යුනියන් පෙදෙසේ අංක 330 දරණ ස්ථානයෙහි ආහාර කොමසාරිස් විසින් භාරගනු ලැබේ.

ආහාර කොමසාරිස් වෙත රු. 100 ක් තැන්පත් කිරීමෙන් 1965 දෙසැම්බර් මස 13 වැනි සඳුදා දහවල් 12.00 දක්වා ලබාගත හැකි පෝර්මවල ටෙන්ඩර් (පිටපත් දෙකකින් යුතුව) ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩරය පිළිබඳ සියලුම කොන්දේසි සහ අවශ්‍ය විස්තර ආහාර කොමසාරිස්ගෙන් ලබාගැනීමට පුළුවන.

බී. සී. පෙරේරා,
ආහාර කොමසාරිස් වෙනුවට.

1965 නොවැම්බර් මස 15 වැනි දින,
ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව,
අංක 330, යුනියන් පෙදෙස,
කොළඹ 2.

11-1007—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය.

---

## අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවිකිරීමේ දෙපා ර්තමේන්තුවේ පලතුරු ඇසිරීමේ කම්හලෙහි ඇති ප්‍රිමියර් 2 ඒ ඇඹරුම් යන්ත්‍රවල 12" තල 1966.1.1 සිට 1966.12.31 දින දක්වා කාලය තුළ මුවහත් කිරීම සඳහා ටෙන්ඩර් පත් 1965 දෙසැම්බර් මස 17 වැනි දින අ. භා. 2.30 දක්වා භාර ගනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම 1965 දෙසැම්බර් මස 17 වැනි දින දහවල් 12 වන තුරු රු. 50 ක මුදලක් තැන්පත් කිරීමෙන් කොළඹ 5 හේ නාරාහේන්පිට පාරේ පිහිටි අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුවේ පළතුරු ඇසිරීමේ කර්මාන්ත ශාලාවේ අලෙවිකිරීමේ සංවර්ධන කොමසාරිස් තුමාගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

කේ. යූ. කමල්ගොඩ,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1965 නොවැම්බර් මස දින,
නාරාහේන්පිට,
පළතුරු කර්මාන්තශාලාවේ දී.

11-1124—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය.

---

## අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ 5, නාරහේන්පිට පාරේ පිහිටි පිං කෑම අංශයට 1966 ජනවාරි 1 දින සිට 1966 දෙසැම්බර් 31 වැනි දින දක්වා කාලය තුළ විනාකිරි සැපයීම පිණිස මිල දර්ශන 1965 දෙසැම්බර් 17 වැනි සිකුරාදා අ. භා. 2.30 දක්වා කැඳවනු ලැබේ. මෙම ඉල්ලුම් පත් කොළඹ 5, නාරාහේන්පිට, පළතුරු කර්මාන්තශාලාවේ අලෙවිකිරීමේ කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක.

2. මිල දර්ශනයන් 65.12.17 දින තෙක් ලබා ගත හැක. සැපයනු ලබන විනාකිරි වෙනුවෙන් ආකෘති මිල දර්ශනයන් සඳහා අවසාන දිනට සහ වේලාවට ප්‍රථම ඉදිරිපත් කළ යුතු වේ.

... කේ. යූ. කමල්ගොඩ,
වැඩබලන අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1965 නොවැම්බර් මස 20 වැනි දින,
නාරාහේන්පිට,
පළතුරු කර්මාන්තශාලාවේ දී.

11-1130—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය.

---

## අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුව

### දැන්වීම් සඳහා ඉල්ලුම් පත්

1966 ජනවාරි 1 දින සිට 1966 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ කොළඹ 5, නාරාහේන්පිට පාරේ අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවට අයත් පළතුරු කර්මාන්තශාලාවේ අක්කර හතරක පමණ භූමියේ ඇති තණකොළ කපා ඉවත් කිරීම සඳහා කොටේෂන් 1965 දෙසැම්බර් 17 වෙනි දින තෙක් භාරගනු ලැබේ.

කොටේෂන් පත් 1965.12.17 දින දවල් 12 වනතෙක් කොළඹ 5, නාරාහේන්පිට පාරේ පළතුරු කර්මාන්ත ශාලාවේ, අලෙවිකිරීමේ කොමසාරිස් විසින් භාර ගනු ලැබේ.

11-1122—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය.

---

## පුත්තලම් දිස්ත්‍රික්කයේ වීරක්කුලිචෝලෙයි මධ්‍යම පංති ව්‍යාපාරයේ අභ්‍යන්තර පාරවල් සෑදීම සඳහා ටෙන්ඩර් කැඳවීම

ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : මහා ලේකම් කාර්යාලය, කොළඹ 1) වීරක්කුලිචෝලෙයි මධ්‍යම පංති ව්‍යාපාරය දීර්ඝ කිරීමේ කොටසේ අභ්‍යන්තර පාරවල් සෑදීම සඳහා 1965 දෙසැම්බර් මස 24 දින දහවල් 12 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත සඳහන් වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට ඉඩ දෙනු ලැබේ.

2. පුත්තලමේ දිසාපති තැන ගෙන් ලබාගත හැකි පෝර්මවල අනු පිටපතක් ද සහිතව ටෙන්ඩර් පත්‍ර එවිය යුතුය. රු. 50ක ටෙන්ඩර් තැන්පත් මුදලක් තැන්පත් කර ලබා ගත්තා ලද කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් ඉහත සඳහන් දිනට කලින් දහවල් 12 තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ ලබාගත හැක. ටෙන්ඩර් තැන්පත් මුදල පුත්තලමේ කච්චේරියේ (ඉඩම් අංශයේ) තැන්පත් කළ යුතුය.

3. මෙම ගිවිසුම අත්සන් තබන ලද දින සිට මාස හයක් ඇතුළතදී පුත්තලමේ දිසාපති තැනට හෝ ඔහු විසින් නිසියාකාරයෙන් බලය පවරනු ලැබූ වෙන යම් නිලධාරියෙකුට එම වැඩය නිම කොට භාරදිය යුතුය. සැහෙන කරුණු ඉදිරිපත් කළහොත් එකී කාල පරිච්ඡේදය දීර්ඝ කිරීම ගැන පුත්තලමේ දිසාපති තැන විසින් සලකා බලනු ඇත.

4. මේ සඳහා වැඩි විස්තර පුත්තලමේ දිසාපති තැනගෙන් ලබා ගත යුතුය.

පුත්තලමේ දිසාපති.

11-1073—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය.

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

### බස්නාහිර දිසාවේ, වග අඩවියට අයිති ඉදිකඩ ගබඩාකර ඇති මිකිණීම සඳහා වූ රු. 9,000 ක් පමණ වන අරළුගෙඩි සඳහා ඉල්ලුම්පත් කැඳවීමයි

ඉහත සඳහන් අරළුගෙඩි විකිණීම සඳහා 1965 දෙසැම්බර් මස 10 වන දින පස්වරු 2.30 දක්වා සීල් තබන ලද ඉල්ලුම්පත් වන සංරක්ෂක විසින් භාරගනු ලැබේ. මෙම අරළුගෙඩි සාමාන්‍ය කාර්යාල වේලාවන් තුළදී වග අඩවි වන නිලධාරි හමුවී ඉදිකඩදී පරීක්ෂා කළ හැක. රාත්තලක් සඳහා ගබඩාවේදී ගෙවිය හැකි මිල ගණන ඉල්ලුම් පත්‍රයේ සඳහන් කළ යුතුය.

2. ඉල්ලුම්පත් ලියා පදිංචි කළ තැපැලෙන් වන සංරක්ෂක (දඩ සැපයීම්) තැපැල් පෙට්ටිය අංක 509, කොළඹ, යන ලිපිනයට තැපැල් කළ යුතුය. තවද, ලියුම් කවරයේ වම් පැත්තේ උඩ කෙළවරේ "අරළු විකිණීම සඳහා ඉල්ලුම්පත්" යන වචන පෙළ සඳහන් කළ යුතුය.

3. පිළිගන්ට යෙදුන ඉල්ලුම්කරු වෙත ඔහුගේ ඉල්ලුම්පත්‍රය භාරගත් බව දන්වා සතියක් ගතවීමට පෙර සම්පූර්ණ මුදල් ගෙවා මුළු අරළුගෙඩි තොගයම ඉවත් කරගත යුතුය.

ඩබ්ලිව්. ජී. වීරරත්න,
වැඩ බලන වන සංරක්ෂක වෙනුවට.

අංක 9, කිච්පාර,
කොළඹ 2.
1965 දෙසැම්බර් මස 18 දින.

11–1082—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය.

---

## කිරි මණ්ඩලයේ ගාල්ල මධ්‍යස්ථානයේ දියුණු කිරීමේ සහ යාකිරීමේ වැඩ

කිරි මණ්ඩලයේ ගාල්ල මධ්‍යස්ථානයේ දියුණු කිරීමේ සහ යාකිරීමේ වැඩ සඳහා කොළඹ 5, නාරාහේන්පිට, කිරි මණ්ඩලයේ සාමාන්‍යාධිකාරි විසින් ටෙන්ඩර්පත්‍ර භාරගනු ලැබේ.

කොළඹ 5, නාරාහේන්පිට පිහිටි කිරි මණ්ඩලයේ කාර්යාලයෙන් ලබාගත හැකි දෙපිටපතකින් යුක්ත ෆෝරම් කොළ සම්පූර්ණ කොට ටෙන්ඩර්කරුවන් තම ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

ආපසු දෙනු ලබන, මුදලින් රු. 100ක් කොළඹ 5, කිරි මණ්ඩලයේ සාමාන්‍යාධිකාරිට ගෙවා ලබාගන්නා කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් ෆෝරම් කොළ ලබාගත හැකිය. 1965 දෙසැම්බර් මස 27 වැනි සඳුදා පස්වරු 3.00 දක්වා ටෙන්ඩර් ෆෝරම් නිකුත් කරනු ලැබේ. රජයේ දෙපාර්තමේන්තුවල රු. 25,000 ට ඉහළ කොන්ත්‍රාත් සඳහා ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවෝ ලියාපදිංචි වීමේ සහතික ටෙන්ඩර් ෆෝරමවල අමුණා එවිය යුතුය.

සියලුම ටෙන්ඩර් 1965 දෙසැම්බර් මස 28 වැනි දින පස්වරු 2.30 ට ප්‍රථම කිරි මණ්ඩලයේ සාමාන්‍යාධිකාරිට ලැබෙන සේ ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතු අතර "කිරි මණ්ඩලයේ ගාල්ල මධ්‍යස්ථානයේ දියුණු කිරීමේ සහ යාකිරීමේ වැඩ සඳහා ටෙන්ඩර්" යනුවෙන් කවරයෙහි වම් පස ඉහළ කෙළවර සඳහන් කළ යුතුයි.

විලියම් සෙනෙවිරත්න,
සාමාන්‍යාධිකාරි,
කිරි මණ්ඩලය.

1965 නොවැම්බර් මස 17 වැනි දින,
කිරි මණ්ඩලීය මූලස්ථානය,
කොළඹ 5.

11–997—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය.

---

## රත්නපුර නගර සීමාව තුළ පිහිටි දිස්ත්‍රික් පාලක ගොඩනැගිලි නඩත්තු කිරීම, වැඩි දියුණු කිරීම හා එකතු කිරීම

1966.9.30 දිනෙන් අවසන් වන මුදල් වර්ෂය සඳහා ඉහත සඳහන් වැඩ කිරීමට ටෙන්ඩර් පත්‍ර, රත්නපුර දිසාපති විසින් 1965 දෙසැම්බර් මස 14 වැනි දින සවස 2.30 දක්වා රජයේ ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ගෙන් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර 1965.12.10 වැනි දින සවස 3 දක්වා රත්නපුර කච්චේරියෙන් ලබාගත හැක. ටෙන්ඩර් පත්‍ර ලබාගැනීමට කලින් රු. 25ක් කච්චේරියේ තැන්පත් කර රිසිට් පතක් ඉදිරිපත් කළ යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර බහාලන කවරයේ වම් කෙළවරේ "රත්නපුර දිස්ත්‍රික් පාලන ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම" යන්න ලියා රෙජිස්ටර් තැපැලෙන් එවිය යුතුයි. නැතිනම් කච්චේරියේ ටෙන්ඩර් පත්‍ර පෙට්ටියේ දැමිය යුතුයි.

4. ටෙන්ඩර් පත්‍ර 1965.12.14 වැනි දින සවස 2.30ට රත්නපුර කච්චේරියේ කාර්යාල සහකාර තැනගේ කාමරයේදී විවෘත කරනු ලැබේ.

ඩබ්ලිව්. පතිරණ,
රත්නපුර දිසාපති.

1965 නොවැම්බර් මස 15 වැනි දින,
රත්නපුර දිසාපති කාර්යාලයේදීය.

11–959—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය.

---

## විභාග දෙපාර්තමේන්තුව

### මුද්‍රණාලයේ කැපි ඉවත ලන කඩදාසි

කඩදාසි ටොන් දෙකක් පමණ විකිණීම සඳහා කොළඹ 2, මැලේ වීදියේ, විභාග දෙපාර්තමේන්තුවේ තබා ඇත. මෙම කඩදාසි තොගය මිලදී ගැනීමට කැමති අයට මෙම කාර්යාලයේදී සතියේ දිනවල පෙරවරු 9.00 සිට පස්වරු 4.00 දක්වාත් සෙනසුරාදා දිනවල පෙරවරු 9.00 සිට පෙරවරු 11.30 දක්වාත් කාලය තුළදී ඒවා පරීක්ෂා කර බැලීමට පුළුවන.

මිල ගණන් සඳහන් කරන ලද ඉල්ලුම් පත්‍ර සීල් තබන ලද කවරයක බහා ලියා පදිංචි කරන ලද තැපැලෙන් මෙම කාර්යාලයට එවිය යුතු අතර, කවරයේ වම් පැත්තේ මුදුන් කෙළවරේ "ඉවත ලන කඩදාසි සඳහා ටෙන්ඩර්" යන්න සඳහන් කොට 1965 දෙසැම්බර් මස 10 වෙනි දින දවල් 2.00ට පෙර කොළඹ 2, මැලේ වීදියේ, විභාග දෙපාර්තමේන්තුවේ, විභාග කොමසාරිස් වෙත එවිය යුතුය.

ටෙන්ඩරය භාරගත් බව දැනුම් දීමෙන් පසු පැය 24 ක් තුළදී මුදල් ගෙවා කඩදාසි තොගය ගෙනයා යුතුය.

එච්. එල්. විමලසූරිය,
වැඩ බලන විභාග කොමසාරිස්.

1965 නොවැම්බර් මස 17 වෙනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
විභාග දෙපාර්තමේන්තුවේදීය.

11–983—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### අන්වීක්ෂ සැපයීම සඳහා ටෙන්ඩර්—1965/66

අන්වීක්ෂ (මයික්‍රස්කෝප්ස්) සැපයීම සඳහා 1966 පෙබරවාරි මස 25 වන සිකුරාදා පෙරවරු 10.30 වන තෙක් කොළඹ 3, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවතේ, "සිරිමතිපායේ" පිහිටි අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයා විසින් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර එවීමට බලාපොරොත්තුවන අය විසින් විස්තර ලේඛන ඉල්ලා සිටි විට අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වෙනුවෙන් කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ බඩු බාහිරා සැපයීමේ ශාඛාව විසින් ඒවා ඔවුනට නොමිලයේ සපයනවා ඇත.

3. කොළඹ ටෙන්ඩර්කරු හවතුන් විසින් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනනමට කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ එච්. ඒ. ශාඛාවෙහිද, කොළඹින් පිට අය විසින් කොළඹින් පිට කච්චේරියක ද රුපියල් 100ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1966 පෙබරවාරි මස 24 වෙනි දින තෙක් සාමාන්‍ය රාජකාරි කාලය තුළදී ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

ටී. බී. විජයරත්න,
අධ්‍යාපන අධ්‍යක්ෂ වෙනුවට.

1965 නොවැම්බර් මස 26 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ය.

11–965—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය.

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

වර්ෂ 1965 දෙසැම්බර් මස 17 වෙනි සිකුරාදා පෙරවරු 10.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර, කොළඹ 2, මලයි වීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| පාසැලේ නම | කළයුතු වැඩය |
|---|---|
| 1. කු/ඉඳුල්ගොඩකන්ද මහා විද්‍යාලය | පාසැල් ගොඩනැගිල්ල. |

අංක (1) සංලක්ෂය :—කු=කුරුණෑගල දිස්ත්‍රික්කය.

අංක (2) අවශ්‍ය ලියාපදිංචි කිරීම.

| අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ | අනුමත කළ සමිති සමාගම් |
|---|---|
| අංක 1 සඳහා රු. 20,000 හෝ ඊට වැඩි ගණනකට. | රු. 20,000 හෝ ඊට වැඩි ගණනකට |

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකින් හෝ, කොළඹ 2, මලයි වීදියේ, අධ්‍යාපන අධ්‍යක්ෂකගේ කාර්යාලයේ රු. 100 ක තැන්පත් මුදලක් සඳහා කුවිතාන්සියක් කුරුණෑගල, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තැන වෙත ඉදිරිපත් කිරීමේ දී අධ්‍යාපන දෙපාතීමේන්තුවේ ඉහත සඳහන් 2 වන අංකයේ සඳහන් මුදලට හෝ ඊට වැඩි මුදලකට ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වූ අයට 1965 දෙසැම්බර් මස 16 වැනි බ්‍රහස්පතින්දා දහවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. චෙක්පත්, මුදල් ඕඩර්, තැපැල් ඕඩර් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල් සඳහා මුදල් ගෙවීමේ කුවිතාන්සි කොළඹ 2, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ, අධ්‍යාපන අධ්‍යක්ෂ, පාසැල් ගොඩනැගිලි අංශයෙන්, හෝ කුරුණෑගල සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ ලබාගත යුතු ය. ඉහත සඳහන් මුදල් ප්‍රමාණයන් සඳහා ලියාපදිංචි වූ බවට සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක් මුදල් ගෙවීමේ කුවිතාන්සි ලබාගත හැකි බව සිතට ගත යුතු ය.

3. පූර්වෝක්ත 2 වැනි අංකයේ නියමිත වශයෙන් දක්වෙන මුදල් ප්‍රමාණය සඳහා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ ලියාපදිංචි වී තිබේ නම්, මෙකී වැඩ සඳහා අනුමත කළ සමිතිවලට ද ටෙන්ඩර් පත් ඉදිරිපත් කළහැකි වේ. අනුමත කළ සමිතිවලට විශේෂ ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන බැවින් ඔවුන්ගේ ටෙන්ඩරය එකී පෝර්මයේ ලියා ඉල්ලුම් කළ යුතු ය. ටෙන්ඩර් තැන්පත් මුදල් ගෙවීමෙන් අනුමත කරනු ලැබූ සමිති නිදහස් ය. යථෝක්ත 2 අංකයේ සඳහන් මුදල් ප්‍රමාණයන් සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසු පමණක් ඒවාට විශේෂ ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. සියළුම විස්තර හා තොරතුරු ලබාගත හැකිවූද, ඔවුන්ගේ කාර්යාලයේ දී සැලැස්ම බලාගත හැකි වූද, කුරුණෑගල සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂතැනගෙන් පූර්වෝක්ත 2 හා 3 ඡේදයන්හි සඳහන් කර තිබෙන ටෙන්ඩර් පත්‍ර ලබාගෙන පිටපත් 2 කින් යුක්තව ලියාපදිංචි කළ තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය. තැපැල් මගින් එවනු ලබන ටෙන්ඩර් පත්‍ර කොළඹ 2, මලයි වීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතු ය. ප්‍රාදේශීය ටෙන්ඩර් කරුවන් විසින් ලියාපදිංචි කළ තැපෑලෙන් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අකමැති වන්නේ නම්, ටෙන්ඩර්කරුගේ සේවා විස්තර, නම, ලිපිනය, කවරයේ දක්වෙන සේ සිල් තැබූ ටෙන්ඩර් තමන් විසින් හෝ තමාගේ නියෝජිතයකු විසින් හෝ, කොළඹ 2, මලයි වීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කාර්යාල සහකාර තැන වෙත පුද්ගලිකව ඉදිරිපත් කොට ඔහුගෙන් ටෙන්ඩරය භාරදුන් බවට ලියවිල්ලක් ලබාගත යුතු ය.

5. 1965 දෙසැම්බර් මස 17 වැනි සිකුරාදා පෙරවරු 10.30 ට කොළඹ 2, මලයි වීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමේ දී ටෙන්ඩර් කරුවන්ට එහි පෙනී සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලබන නිලධාරි තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ මිල ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් වෙත දැනුම් දෙනු ලැබේ.

6. ටෙන්ඩර් පත්‍ර අවසන් වන දින සිට සති 6 ක කාල පරිච්ඡේද යක් දක්වා තමන් ඉල්ලුම් කළ මිල ගණනට වැඩය භාර ගැනීමට ටෙන්ඩර් කරුවන් කැමති විය යුතු ය.

7. තවදුරටත් අවශ්‍ය විස්තර, ටෙන්ඩර් ලියකියවිලි, පරීක්ෂාකිරීම පිණිස කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයෙන් ලබාගත හැකි ය.

8. උළු සෙවිලි කළයුතු ගොඩනැගිලිවලට මෙරට උළු යෙදිය යුතුය. මෙම උළුවල තරාතිරම නියත වශයෙන් දැනගැනීමට පරීක්ෂණයක් අවශ්‍ය නම්, එය පැවැත්වීම සඳයන්නාගේ වියදමින් විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ලංකා ආයතනය මගින් කරගත හැකි වේ.

ඩබ්ලිව්. ඩී. සී. මහතන්තිල,
වයඹ ප්‍රදේශයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ.

1965 නොවැම්බර් 20, වැනි දින,
කුරුණෑගල, අධ්‍යාපන කාර්යාලයේ දී ය. .

11–1085/1—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

වර්ෂ 1965 දෙසැම්බර් මස 17 වෙනි සිකුරාදා පෙරවරු 10.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර, කුරුණෑගල, අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| පාසැලේ නම | කළයුතු වැඩය |
|---|---|
| 1. කු/ගෝනිගොඩ මහා විද්‍යාලය | විශාල අළුත්වැඩියාව. |
| 2. කු/තෙලහැර විද්‍යාලය | පාසැල් ගොඩනැගිල්ල. |
| 3. කු/කුඹකෝවාන විද්‍යාලය | පාසැල් ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ. |

අංක (1) සංලක්ෂ්‍යය :—කු=කුරුණෑගල දිස්ත්‍රික්කය.

අංක (2) අවශ්‍ය ලියාපදිංචි කිරීම.

| අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ | අනුමත කළ සමිති සමාගම් |
|---|---|
| අංක 1 සිට 2 දක්වා රු. 15,000 හෝ ඊට වැඩි ගණනකට. | රු. 15,000 හෝ ඊට වැඩි ගණනකට |
| අංක 3 සඳහා රු. 10,000 හෝ ඊට වැඩි ගණනකට. | රු. 10,000 හෝ ඊට වැඩි ගණනකට |

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකින් හෝ, කොළඹ 2, මලයි වීදියේ, අධ්‍යාපන අධ්‍යක්ෂකගේ කාර්යාලයේ රු. 100 ක තැන්පත් මුදලක් සඳහා කුවිතාන්සියක් කුරුණෑගල, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තැන වෙත ඉදිරිපත් කිරීමේ දී අධ්‍යාපන දෙපාතීමේන්තුවේ ඉහත සඳහන් 2 වන අංකයේ සඳහන් මුදලට හෝ ඊට වැඩි මුදලකට ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වූ අයට 1965 දෙසැම්බර් මස 16 වැනි බ්‍රහස්පතින්දා දහවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. චෙක්පත්, මුදල් ඕඩර්, තැපැල් ඕඩර් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල් සඳහා මුදල් ගෙවීමේ කුවිතාන්සි කොළඹ 2, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ, අධ්‍යාපන අධ්‍යක්ෂ, පාසැල් ගොඩනැගිලි අංශයෙන්, හෝ කුරුණෑගල සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ ලබාගත යුතු ය. ඉහත සඳහන් මුදල් ප්‍රමාණයන් සඳහා ලියාපදිංචි වූ බවට සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක් මුදල් ගෙවීමේ කුවිතාන්සි ලබාගත හැකි බව සිතට ගත යුතු ය.

3. පූර්වෝක්ත 2 වැනි අංකයේ නියමිත වශයෙන් දක්වෙන මුදල් ප්‍රමාණය සඳහා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ ලියාපදිංචි වී තිබේ නම්, මෙකී වැඩ සඳහා අනුමත කළ සමිතිවලට ද ටෙන්ඩර් පත් ඉදිරිපත් කළහැකි වේ. අනුමත කළ සමිතිවලට විශේෂ ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන බැවින් ඔවුන්ගේ ටෙන්ඩරය එකී පෝර්මයේ ලියා ඉල්ලුම් කළ යුතු ය. ටෙන්ඩර් තැන්පත් මුදල් ගෙවීමෙන් අනුමත කරනු ලැබූ සමිති නිදහස් ය. යථෝක්ත 2 අංකයේ සඳහන් මුදල් ප්‍රමාණයන් සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසු පමණක් ඒවාට විශේෂ ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. සියළුම විස්තර හා තොරතුරු ලබාගත හැකිවූද, ඔවුන්ගේ කාර්යාලයේ දී සැලැස්ම බලාගත හැකි වූද, කුරුණෑගල සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂතැනගෙන් පූර්වෝක්ත 2 හා 3 ඡේදයන්හි සඳහන් කර තිබෙන ටෙන්ඩර් පත්‍ර ලබාගෙන පිටපත් 2 කින් යුක්තව ලියාපදිංචි කළ තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය. තැපැල් මගින් එවනු ලබන ටෙන්ඩර් පත්‍ර කුරුණෑගල, අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතු ය. ප්‍රාදේශීය ටෙන්ඩර් කරුවන් විසින් ලියාපදිංචි කළ තැපෑලෙන් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අකමැති වන්නේ නම්, ටෙන්ඩර්කරුගේ සේවා විස්තර, නම, ලිපිනය, කවරයේ දක්වෙන සේ සිල් තැබූ ටෙන්ඩර් තමන් විසින් හෝ තමාගේ නියෝජිතයකු විසින් හෝ, කුරුණෑගල, අධ්‍යාපන කාර්යාලයේ කාර්යාල සහකාර තැන වෙත පුද්ගලිකව ඉදිරිපත් කොට ඔහුගෙන් ටෙන්ඩරය භාරදුන් බවට ලියවිල්ලක් ලබාගත යුතුය.

5. 1965 දෙසැම්බර් මස 17 වැනි සිකුරාදා පෙරවරු 10.30 ට කුරුණෑගල, අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමේ දී ටෙන්ඩර් කරුවන්ට එහි පෙනී සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලබන නිලධාරී තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ මිල ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් වෙත දැනුම් දෙනු ලැබේ.

6. ටෙන්ඩර් පත්‍ර අවසන් වන දින සිට සති 6 ක කාල පරිච්ඡේදයක් දක්වා තමන් ඉල්ලුම් කළ මිල ගණනට වැඩය භාර ගැනීමට ටෙන්ඩර් කරුවන් කැමති විය යුතු ය.

7. තවදුරටත් අවශ්‍ය විස්තර, ටෙන්ඩර් ලියකියවිලි, පරීක්ෂා කිරීම පිණිස කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයෙන් ලබාගත හැකි ය.

8. උළු සෙවිලි කළයුතු ගොඩනැගිලිවලට මෙරට උළු යෙදිය යුතුය. මෙම උළුවල තරාතිරම නියත වශයෙන් දනගැනීමට පරීක්ෂණයක් අවශ්‍ය නම්, එය පැවැත්වීම සපයන්නාගේ වියදමින් විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ලංකා ආයතනය මඟින් කරගත හැකි වේ.

ඩබ්ලිව්. බී. සී. මහතන්තිල,
වයඹ ප්‍රදේශයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ.

1965 නොවැම්බර් 20, වැනි දින,
කුරුණෑගල, අධ්‍යාපන කාර්යාලයේ දී ය.

11-1085/2—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### කළුතර සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශය—බඩු ප්‍රවාහණය

1966.1.1 වෙනි දින සිට 1967.12.31 දින දක්වා කාලය තුළ මේ සමඟ ඇති උපලේඛනයෙහි සඳහන් වන ආයතනයන්ට එහි සඳහන් දුම්රිය ස්ථානයන් සිට බඩු ප්‍රවාහනය කිරීම සඳහා ලාංකිකයන්ගෙන්, ලාංකික සමාගම් හෝ සමුපකාර සමිති මඟින් එවන ටෙන්ඩර් පත්‍ර කළුතර පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේ දී සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.—රුපියල් 100 ක මුදලක් ළඟම කච්චේරියේ කළුතර සෞඛ්‍ය සේවා අධිකාරි නමට තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර.—1965 දෙසැම්බර් 15 දින දහවල් 12ට දක්වා මෙම කාර්යාලයෙන් හෝ පහත සඳහන් සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාල වලින් ටෙන්ඩර් පත්‍ර ලබා ගතහැක :—

| | | | | |
|---|---|---|---|---|
| අනුරාධපුරය | ගාල්ල | කෑගල්ල | පුත්තලම | මහනුවර |
| මඩකලපුව | යාපනය | කුරුණෑගල | රත්නපුර | මාතර |
| බදුල්ල | කළුතර | වවුනියා | කොළඹ | |

ටෙන්ඩර් පත්‍ර නිකුත් කරන්නේ පහත සඳහන් කොන්දේසි දෙක සම්පූර්ණ කළහොත් පමණයි :—

(1) තැන්පත් මුදල පිළිබඳ ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුයි.

(2) තමාගේ වත්කම් පිළිබඳ ප්‍රකාශයක් අත්සන් සහිතව ඉල්ලුම්කරු ඉදිරිපත් කළ යුතුයි.

4. වත්කමේ විස්තර.—සෑම ඉල්ලුම් කරුවෙක්ම, තමා රජය සමග කොන්ත්‍රාත් ගිවිසුම් වලට බැඳී සිටියත් නැතත් වත්කම පිළිබඳ ප්‍රකාශය ඉදිරිපත් කළ යුතුයි. මෙය සඳහා අවශ්‍ය ආකෘති පත්‍ර කල් ඇතිව ලබාගත යුතුයි.

5. ගණන් බලා ලද ප්‍රවාහන වැඩ සංඛ්‍යාව.—ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අයගේ දනගැනීම පිණිස දළ වශයෙන් වර්ෂයකට ඇති ප්‍රවාහන වැඩ පිළිබඳ විස්තර මෙම කාර්යාලයේ දී බලාගත හැක. යම් කිසි බර ප්‍රමාණ සීමාවක් ඇතුළත කිසිත් ප්‍රවාහන වැඩ පසුගිය වර්ෂයේ නොතිබුනේ නම් ඊට කලින් වර්ෂයේ විස්තර මෙම ලේඛනයට ඇතුළත් කර තිබේ.

6. ටෙන්ඩර් ඉදිරිපත් කළයුතු ආකාරය.—පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍ර එකම කවරයක බහා කළුතර සෞඛ්‍ය සේවා අධිකාරි නමට ලිපිනය ලියා ලියුම් කවරයට සිල් තබා එවිය යුතුයි. කවරයේ වම් කෙළවරේ ඉහල කොටසේ ටෙන්ඩර් කුමන සේවයකට යන වග ලියා සඳහන් කළ යුතුයි. ඊට පහළින් ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනය සඳහන් කළ යුතුයි.

ටෙන්ඩර් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියා පදිංචි තැපෑලෙන් හෝ ලැබෙන්නට සැලැස්විය හැක. නො එසේ නම් මෙම කාර්යාලයේ ලේකම් මහතා අතට දී ලැබුණු බවට කුවිතාන්සියක් ලබා ගත යුතුයි.

7. ප්‍රවාහන ගාස්තු.—තුන් ආකාරයකින් යුත් අයකිරීම් සඳහන් කළ යුතුයි.

(i) සෑම ගමනකටම සමාන ගාස්තුව.

(ii) බර ප්‍රමාණය අනුව අයකරන ගාස්තුව. මෙහිදී පෙට්ටි ගණන සැලකිය යුතු නැත.

(iii) බර ප්‍රමාණය අනුව වර්ග කරන ලද කොටස්වලට අය කරන ගාස්තුව. ටෙන්ඩර් පත්‍ර බාර ගැනීම රජයට වාසිවන මෙයින් කුමන ක්‍රමය හෝ අනුව සලකනු ලැබේ.

8. ප්‍රවාහනයට යොදන වාහන විස්තර.—මෙම සේවයට යොදන වාහනය, එහි ලියා පදිංචි අංකය හා එහි බර හා ගෙනයිය හැකි බඩුවල ප්‍රමාණය දක්විය යුතුයි. මෙය සඳහන් නොකිරීම ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කිරීමට හේතුවේ.

9. ටෙන්ඩර් පත් බාරගන්නා අවසාන දිනය.—1965 දෙසැම්බර් 16 වෙනි දින පූ.භා. 10ට ටෙන්ඩර් පත් බාරගෙන අවසන් වනවා ඇත.

10. ටෙන්ඩර් පත් විවෘත කිරීම.—ටෙන්ඩර්පත්‍ර විවෘත කරන වේලාවට ටෙන්ඩර් කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් පැමිණ සිටින පිරිස ඉදිරියේ කියවනු ඇත. යම්කිසි ටෙන්ඩර්කරුවෙකුට යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් පරීක්ෂා කර බැලීමට උවමනා නම් සෞඛ්‍ය අධිකාරි සමඟ පිළියෙළකරගෙන ටෙන්ඩරයේ පිටපත් කොපිය බැලීමට ඉඩදෙනු ලැබේ.

11. ටෙන්ඩර් පිළිබඳ වෙනත් කොන්දේසි.—මේවා ටෙන්ඩර් පත්‍රයේ දෙවෙනි පිටුවේ දක්නට ලැබේ. මේවා සුපරීක්ෂාකාරීව කියවා දනගත යුතුවා මෙන් ම පිළිපැදිය යුතුද වන්නේය.

12. ටෙන්ඩර් බාර ගැනීම.—(අ) නියම ආකෘති පත්‍රයේ ලියා නොමැති නම්, (ආ) උවමනා සියළු විස්තර නොසපයා, සෑම කොන්දේසියක්ම ඉෂ්ට කර නැත්නම් කිසිම ටෙන්ඩර් පතක් බාරගනු නොලැබේ.

යම්කිසි ටෙන්ඩර් පතක් හෝ සියළුම ටෙන්ඩර් පත් කිසිම හේතුවක් නොදක්වා ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය රජය සතුවන්නේය. එසේම සම්පූර්ණ ටෙන්ඩර් පතේ හෝ ඉන් කොටසක් නියමිත කාලසීමාවට අඩු කාලසීමාවක් තුළ භාරගැනීමේ හිමිකම ද රජය සතුය.

ඒ. නාගේන්ද්‍රන්,
කළුතර සෞ.සේ. අධිකාරි.

1965 නොවැම්බර් 15 වැනි දින,
කළුතර සෞ.සේ. අධිකාරි කාර්යාලයේ දී ය.

### පූර්වෝක්ත උපලේඛනය

| (1) සේවය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. | (3) ආරක්ෂක තැන්පත් මුදල රු. | (4) ටෙන්ඩර් වැසීමේ දිනය හා වේලාව |
|---|---|---|---|
| බඩුබාහිරාදිය දුම්රිය පොලවලින් හා දුම්රියට බඩු ගන්නා ස්ථාන වලින් වෛද්‍ය ආයතන වලට ගෙනයෑම, එම ආයතනවලින් දුම්රිය පොළට හෝ දුම්රියට බඩු බාර ගන්නා ස්ථාන වලට ගෙන ඒම | | | |
| කළුතර දිස්ත්‍රික්කය— | | | |
| පානදුර සහ වාද්දුව ... ... ... ... | 100 ... | 300 ... | 16.12.65 පෙරවරු 10ට |

11-925—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—කොළඹ කොට්ඨාශය

### සේවයට අයෝග්‍ය මෝටර් රථ මිළයට ගැනීම

කළුබෝවිල, දකුණු කොළඹ රෝහලේ තිබෙන සේවයට අයෝග්‍ය පහත සඳහන් මෝටර් රථය මිළයට ගැනීම සඳහා, සීල් තබන ලද ටෙන්ඩර් 1965 දෙසැම්බර් මස 17 දින පෙරවරු 10 වන තෙක් කොළඹ, සෞඛ්‍ය සේවා අධිකාරි විසින් භාරගනු ලැබේ. විකිණීමට තිබෙන මෝටර් රථය පහත දැක්වේ. එම මෝටර් රථය කළුබෝවිල, දකුණු කොළඹ රෝහලේ දැනට නවතා ඇත. කාර්යාලය ඇර තබා ඇති කාලයන් තුළදී ඒ රෝහල භාර වෛද්‍ය අධිකාරිගේ අවසරය පිට එම රථය පරීක්ෂාකර බැලීමට පුළුවන.

ඔස්ටින් ගිලන් රථය—සී. වී. 3604, කළුබෝවිල දකුණු කොළඹ රෝහල.

2. ටෙන්ඩර් පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතු අතර රු. 100ක මුදලක් කොළඹ, සෞඛ්‍ය සේවා අධිකාරි නමින් කච්චේරියේ තැන්පත් කළ කුවිතාන්සියක් ඉදිරිපත් කර 1965.12.16 දින දවල් 12 ට පෙර ටෙන්ඩර් පෝර්ම කොළඹ, සෞඛ්‍ය සේවා අධිකාරිගේ මුදල් අංශයෙන් ලබාගත හැක.

3. ටෙන්ඩර් ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම් පස උඩ කෙළවරේ "සේවයට අයෝග්‍ය මෝටර් රථ මිළයට ගැනීම සඳහා ටෙන්ඩර්" කියා සඳහන් කර, කොළඹ, සෞඛ්‍ය සේවා අධිකාරිගේ ලිපිනයට එවිය යුතුය. වම් පස පහත කෙළවරේ ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනය සඳහන් කළ යුතුය.

4. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී පැමිණ සිටීමට පුළුවන. පළමුවැනි ඡේදයේ සඳහන් යටකී දිනයේ වේලාව පසුවූ වහාම ටෙන්ඩර් පත්‍රකරුවන්ගේ නම් සහ ඉදිරිපත් කළ මිළ ගණන් කියවනු ලැබේ.

5. ටෙන්ඩර් විවෘත කළ පසු දින තුනක් ඇතුළත සම්පූර්ණ මුදල ගෙවා රථ වාහනය ගෙන ගිය යුතුය. එසේ ගෙන නොගියහොත් ඔවුන්ගේ ඇප මුදල රාජසන්තක කරනු ලැබේ.

6. ටෙන්ඩර් පත්‍ර සියල්ලම හෝ කොටසක් වශයෙන් භාරගැනීම හෝ ප්‍රතික්ෂෙප කිරීමේ බලය කොළඹ, සෞඛ්‍ය සේවා අධිකාරි වෙත තබාගනු ලැබේ.

එල්. ආර්. ජේ. වෙරසන්,
කොළඹ සෞඛ්‍ය සේවා අධිකාරි.

83, කිංසි පාර,
කොළඹ.
1965.11.9.

11-1027—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—රජයේ බෙහෙත් ගබඩාව

### ඖෂධ සැපයීම සඳහා මිළ ගණන් කැඳවීම

මෙයට යා කොට ඇති උපලේඛනයෙහි සඳහන් ඖෂධයන් දැනට ඇති තොගවලින් සැපයීම සඳහා සීල් තබන ලද මිළ ගණන් ප්‍රාදේශිය ඖෂධ නිශ්පාදකයන්ගෙන් හෝ බලය ලත් ප්‍රාදේශිය ඖෂධ සපයන්නන්ගෙන් හෝ රජයේ බෙහෙත් ගබඩාවේ අධිකාරි විසින් 1965.12.17 දින දක්වා භාර ගනු ලැබේ. ඉදිරිපත් කරනු ලබන මිළ ගණන් 1965.12.17 දින සිට ඉදිරියට මාස 6ක් වලංගුව පැවතිය යුතුය.

2. මිළ ගණන් එවීම සඳහා ආකෘති පත්‍ර දෙපාර්තමේන්තුව විසින් සපයනු නො ලැබේ. ටෙන්ඩර්කරුවනට උපලේඛනයේ සඳහන් එක් ද්‍රව්‍යයක් හෝ ද්‍රව්‍ය කිහිපයක් සඳහා මිළ ගණන් එවීම පිණිස ස්වීය ආකෘති පත්‍ර පාවිච්චි කළ හැක.

3. සියළුම මිළ ගණන්, කොළඹ, ඩීන්ස් පාරේ අංක 355 දරණ තැන පිහිටි රජයේ බෙහෙත් ගබඩාවේ අධිකාරි වෙත එවිය යුතුය. සීල් තැබූ මිළ ගණන් බහාලූ කවරයේ වම්පස උඩ කෙළවර, ''ඖෂධ සැපයීම සඳහා මිළ ගණන් කැඳවීම'' යනුවෙන් සඳහන් කළ යුතු අතර, ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය ද සඳහන් කළ යුතුය.

සීල් තැබූ මිළ ගණන් රජයේ බෙහෙත් ගබඩා අධිකාරිගේ කාර්යාල කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කළ යුතුය.

4. 1965.12.17 දින සිට 1966.6.16 දක්වා කාලය තුළ උප ලේඛනයේ සඳහන් බෙහෙත් ද්‍රව්‍ය මිළ දී ගැනීම සඳහා පිළිගනු ලැබූ ටෙන්ඩර්කරු හෝ ටෙන්ඩර්කරුවන් මෙම කාර්යාලයේ ලියා පදිංචි කර තබනු ඇත.

5. පිළිගත් ටෙන්ඩර්කරුවන්ගේ නම්, මිළ ගණන් හා ද්‍රව්‍යයන් යථා කාලයේ දී ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබේ.

6. කිසිම හේතුවක් නොදක්වා යම් මිළ ගණනක් හෝ මිළ ගණන් සියල්ලම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත.

ඩී. ඒ. ඒ. මුනසිංහ,
රජයේ බෙහෙත් ගබඩාවේ අධිකාරි.

1965.11.17 වනදා,
කොළඹ, ඩීන්ස් පාරේ,
අංක 355 දරණ තැන පිහිටි
රජයේ බෙහෙත් ගබඩාවේ කාර්යාලයේ දී ය.

### උපලේඛන

#### "අ" උපලේඛනය—ඖෂධ I කොටස

| (1) ද්‍රව්‍ය විස්තරය | (2) ඒකක | (3) මිළ | (4) ඉදිරිපත් කැරෙන ප්‍රමාණය |
|---|---|---|---|
| 1. විටමින් සී පෙති | — | — | — |
| 2. විටමින් බී කොම්ප්ලෙක්ස් පෙති | — | — | — |
| 3. මල්ටි විටමින් පෙති | — | — | — |
| 4. සොලුයුබල් ඇස්පිරින් 2½ ග්‍රෑම් පෙති | — | — | — |
| 5. සොලුයුබල් ඇස්පිරින් 5 ග්‍රෑ. පෙති | — | — | — |
| 6. ප්‍රොමෙසතීන් හයිඩ්‍රොක්ලොරයිඩ් 0.25 ග්‍රෑ. පෙති | — | — | — |
| 7. ටොල්බියුටමයිඩ් පෙති | — | — | — |
| 8. සල්පඩයසින් පෙති | — | — | — |
| 9. නෝමල් සේලයින් ඉන්ජෙක්ෂන්—පයින්ට් එකේ බෝතල | — | — | — |
| 10. ඩෙක්ස්ට්‍රොස් 5% ඉන්ජෙක්ෂන්—පයින්ට් එකේ බෝතල | — | — | — |
| 11. ඉන්සුලින් ලෙන්ටෙ යුනිට් 40 | — | — | — |
| 12. ඉන්සුලින් ප්ලේන් යුනිට් 80 | — | — | — |
| 13. ඉන්සුලින් ප්ලේන් යුනිට් 40 | — | — | — |
| 14. අ (ර්) ගොමට්‍රින් මි. ග්‍රෑ. 5 ඇම්පියුල | — | — | — |
| 15. හාෆ් ක්‍රීම් පව්ඩර්ඩ් මිල්ක් | — | — | — |
| 16. මැලතීන් පව්ඩර් | — | — | — |
| 17. සෝඩියම් බයිකාබනේට් බී. පි. | — | — | — |
| 18. සෝඩියම් සැලිසිලේට් බී.පී. | — | — | — |
| 19. ඇස්පිරින් බී. පී. පව්ඩර් | — | — | — |
| 20. ඇමෝනියම් බයිකාබනේට් බී. පී. | — | — | — |
| 21. ක්‍රිටා ගැලික් | — | — | — |
| 22. ග්ලිසරින් 99.5% | — | — | — |
| 23. තලයිසල්ෆතයසෝල් බී.පී. 0.5 ග්‍රෑ. | — | — | — |
| 24. සල්පමැසතීන් බී.පී. 0.5. ග්‍රෑ. | — | — | — |

"අ" උපලේඛනය—ඖෂධ—II කොටස

| (1) ද්‍රව්‍ය විස්තරය | (2) ඒකක | (3) මිළ | (4) ඉදිරිපත් කැරෙන ප්‍රමාණය |
| --- | --- | --- | --- |
| 1. ට්‍රයිප්ලුඕපෙරසින් පෙති | — | — | — |
| 2. ගුවනතඩීනා පෙති | — | — | — |
| 3. මෙට්‍රනිඩසෝල් පෙති | — | — | — |
| 4. ක්ලෝරප්‍රොමසින් හයිඩ්‍රොක්ලෝරයිඩ් පෙති | — | — | — |
| 5. පිමිඩොන් පෙති | — | — | — |
| 6. ෆිනයිල් බියුටසෝන් පෙති | — | — | — |
| 7. ඔක්සිපෙනෝතියම් පෙති | — | — | — |
| 8. බෙටමෙතසෝන් පෙති | — | — | — |
| 9. ප්‍රෙඩ්නිසෝලෝන් පෙති | — | — | — |
| 10. ඉම්ප්‍රමින් පෙති | — | — | — |
| 11. මෙතිල්ඩෝපා පෙති | — | — | — |
| 12. පෙන්ටයරිත්‍රයිටෝල් පෙති | — | — | — |
| 13. ප්‍රොස්ටිග්මින් පෙති | — | — | — |
| 14. ඇලුමිනියම් හයිඩ්‍රොක්සයිඩ් පෙති | — | — | — |
| 15. ග්‍රිසොෆේපාල්වින් පෙති | — | — | — |
| 16. මෙපයිරමින් මැලිඒට් ඉන්ජෙක්ෂන් | — | — | — |
| 17. ඔක්සිටෝසින් ඉන්ජෙක්ෂන් | — | — | — |
| 18. හයිඩ්‍රොකෝටිසොන්හෙමසයිනේට් සෝඩියම් ඉන්ජෙක්ෂන් | — | — | — |
| 19. නැන්ඩ්‍රලෝන් ඉන්ජෙක්ෂන් | — | — | — |
| 20. හෙපරින් ඉන්ජෙක්ෂන් | — | — | — |
| 21. අයන් ඩෙක්ස්ට්‍රාන් කොම්පිලෙක්ස් ඉන්ජෙක්ෂන් | — | — | — |
| 22. ටෙට්‍රසයික්ලින් හයිඩ්‍රොක්ලෝරයිඩ් අයි. වි. ඉන්ජෙක්ෂන් | — | — | — |
| 23. ටෙට්‍රසයික්ලින් හයිඩ්‍රොක්ලෝරයිඩ අයි. එම්. ඉන්ජෙක්ෂන් | — | — | — |
| 24. ක්ලොරොම්පෙනිකෝල් අයි.වි./අයි.එම්. ඉන්ජෙක්ෂන් | — | — | — |
| 25. සයිකැට්‍රින් 15 මි. ග්‍රෑ. වයල්ස් | — | — | — |
| 26. එන්ඩොක්සාන් 200 මි. ග්‍රෑ. වයල්ස් | — | — | — |

11—1044—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### යාපනය කොට්ඨාශය

පහත දැක්වෙන පාවිච්චියට නුසුදුසු ගිලන් රථය මිළදී ගැනීමට අපේක්ෂා කරන අයගෙන් ටෙන්ඩර්පත්‍ර කැඳවනු ලැබේ:—

ඔස්ටින් ගිලන් රථය : සී එල් 3375

මෙම රථය පරීක්‍ෂා කර බැලීමට අවශ්‍ය වේ නම් සතියේ දිනක උදේ 9 ටත් 4.30 ටත් අතර වේලාව තුළදී යාපනය මහ රෝහලේ වෛද්‍ය අධිකාරීතැනගේ අවසර ඇතුව යාපනය මහ රෝහලේ භූමියේදී බැලිය හැක.

කච්චේරියක රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් බැඳ, ඒ බවට ලබාගන්නා ලද කුවිතාන්සියක්, යාපනයේ සෞඛ්‍ය සේවා අධිකාරීතැන වෙත ඉදිරිපත් කිරීමෙන් 1965.12.9 දින දහවල් 12 වන තෙක් ටෙන්ඩර්පත්‍ර පෝරම ලබා ගත හැක. මෙසේ ලබා ගන්නා ලද නියමිත පෝරමයක නොලියූ කිසිම ටෙන්ඩර් පත්‍රයක් සලකා බලනු නොලැබේ.

යමෙකුට ඔහුගේ ටෙන්ඩරය පිළිගත් බව යාපනයේ සෞඛ්‍ය සේවා අධිකාරි විසින් ලියමනකින් දන්වනු ලැබීමෙන් දින 14ක් ඇතුළත දී ටෙන්ඩරයෙහි සම්පූර්ණ වටිනාකම කච්චේරියක තැන්පත් කිරීමට නුපුළුවන් විනි නම් හෝ එසේ කිරීමෙන් වැලකී සිටි නම් තැන්පත් කරන ලද මුදල් රාජසන්තක වෙනවා ඇත. අනිකුත් සැම තැන්පත් මුදලක්ම ටෙන්ඩේසිය අවසන් වූ පසු ආපසු ගෙවනු ලැබේ.

ටෙන්ඩර්පත්‍ර බහා ලූ කවර සීල් තබා ඒවායේ වම් පැත්තේ උඩ කෙළවරේ " පාවිච්චියට නුසුදුසු ගිලන් රථය මිළදී ගැනීම සඳහා ටෙන්ඩරය " යයි ලියා 1965.12.10 දින පෙරවරු 10 ට පෙර යාපනයේ සෞඛ්‍ය සේවා අධිකාරි වෙත ලැබෙන සේ එවිය යුතුයි.

තැපැලෙන් එවන ටෙන්ඩර්පත්‍ර ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුයි. තැපැලෙන් නොඑවනු ලබන ටෙන්ඩර්පත්‍ර කවරයක බහා සීල් තබා, ටෙන්ඩර්කරු විසින් හෝ ඔහුගේ නියෝජිතයකු විසින් යාපනයේ සෞඛ්‍ය සේවා අධිකාරි තැනට භාරදී ඒ බවට ලියවිල්ලක් ලබා ගත යුතුයි.

1965.12.10 දින පෙරවරු 11 ට යාපනය සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේදී ටෙන්ඩර්පත්‍ර විවෘත කරනු ලැබේ. මේ වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ.

සාර්ථක වූ ටෙන්ඩර්කරු ඔහු විසින් ම වාහනය ඉවත් කර ගැනීමට සුදුසු විධිවිධාන යොදා ගත යුතුය.

කිසියම් ප්‍රශ්න කිරීමක් නොමැතිව ටෙන්ඩර්පත්‍ර සමහරක් හෝ සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ බලය රජය වෙත තබාගනු ලැබේ.

නා. සිවඥානපිරගාසම්,
සෞඛ්‍ය සේවා අධිකාරි වෙනුවට.

1965 නොවැම්බර් මස 18 වැනි දින,
යාපනේ සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේදී ය.

11-1042—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මහනුවර සෞ. සේ. අධිකාරි කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්‍ෂ 1966 ජනවාරි 1 වෙනිදා සිට 1966 දෙසැම්බර් 31 වෙනිදා දක්වා (දින දෙකම ඇතුළුව) කාලය තුල මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයෙහි සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන් ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර මහනුවර පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේ දී සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයෙහි දෙවන තීරයෙහි සඳහන් නියම කරන ලද මුදල් මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුය. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති හෝ ඇතුළත් සංගම් හා විවිධ සංගමවලට අයිති සංගමවලටද, තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළයුතුය.

භාරදීමේ ක්‍රමය.

මෙහි විෂය අංක 1—6 දක්වාවූ සියළුම භාණ්ඩ ඉතා කිට්ටු සමාන තොග දෙකකින් කොළඹ රජයේ බෙහෙත් ගබඩාවට ගෙනැවිත් භාර දිය යුතුය. පළමුවන තොගය ඇනවුම් කළ දින සිට මාස 3ක් ඇතුළතද, ඉතිරි තොගය ඉන්පසු එන මාස 3 ඇතුළත ද සැපයිය යුතු වේයි.

ටෙන්ඩර්කරු ණයවර ලිපියක් විවෘත කරන ලෙස ආණ්ඩුවෙන් ඉල්ලා සිටින්නේ නම්, යඳහන් කරන මිළ ගණන, මිළ සහ කොළඹට ගෙනඊමේ ගාස්තු හා ඇතිරීම් ඇතුළුව අනිකුත් සියලුම ගාස්තු සහිතව මිළ, භාණ්ඩ නිෂ්පාදන රටේ මුදලින් හා ලංකා මුදලින් ද සඳහන් කළ යුතු වෙයි. නාවික වාරු කිරීම්වලට අවසර දෙනු නොලැබේ.

මෙම සැපයීමේ සෑම භාණ්ඩවල හා ඒවා බහා එවන සියළුම භාජනවල ''ඔටුන්න ලකුණ'' හා ඩී/සිඑච්එස් 2730/65–66 යනුවෙන් සඳහන් කර තිබිය යුතුය.

11–1127—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය

---

යොමු අංකය එච්ජී.සී66/65

## සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

### පෝලියෝ වැක්සීන් ආදිය සැපයීම

මෙහි පහත පෙනෙන උප ලේඛනයෙහි සඳහන් පරිදි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැනට පෝලියෝ වැක්සීන් සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1966.2.22 අඟහරුවාද උදේ 10 ය දක්වා බාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යු තුය. අවශ්‍ය ටෙන්ඩර් ආකෘති පත්‍ර කොළඹ 10, ඩීන්ස් පාරේ අංක 355 දරණ තැන පිහිටි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැනගේ (සැපයීම් අංශය) කාර්යාලයෙන් ලබා ගත හැක. මෙම දැන්වීමේ 5 වන හා 6 වන ඡේදයන්හි සඳහන් කරුණු අනුව 1966.2.21 වැනි සඳු දින උදේ 10 දක්වා ඉල්ලුම්කරුවන් වෙත ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

3. සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්, සීල් තබන ලද කවරයක බහා, ''සභාපති තැන, ටෙන්ඩර් මණ්ඩලය, සෞඛ්‍ය අමාත්‍යාංශය, තැ. පෙ.500,පළමු වන මහල, මහා ලේකම් ගොඩනැගිල්ල, ගාලු මුවදෙර, කොළඹ'' යන ලිපිනයට එවිය යුතු වෙයි. සීල් තබන ලද ටෙන්ඩර් පත් බහා ලන ලද කවරයේ වම් කෙළවරේ උඩ, '' පෝලියෝ වැක්සීන් ආදිය සැපයීම සඳහා ටෙන්ඩර්, 1966.2.22 දින උදේ 10 ට '' යනුවෙන් සඳහන් කළ යුතු වෙයි.

4. ටෙන්ඩර් ගාලු මුවදෙර මහා ලේකම් ගොඩනැගිල්ලේ පිහිටි සෞඛ්‍ය ආමාත්‍යාංශයේ, කාමර අංක 155 හේ ඇති ටෙන්න්ඩර් පෙට්ටියට දැමීම හෝ ලියා පදිංචි තැපැලෙන් හෝ එවීම කළ හැක. එහෙත් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන්, තමන්ට අවශ්‍යයයි හැඟේ නම්, සීල් තබන ලද ටෙන්ඩර් පත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ උප ලේකම් තැන වෙත පුද්ගලිකව ගෙනැවිත් බාරදීම ද කළ හැක. එසේ බාර දෙන සීල් තබන ලද කවරයේ, එය කිනම් සැපයීමක් සඳහාද යන වග හා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. එම ටෙන්ඩර් පත් බාර ගැනීම සඳහා ඉහත කී නිලධාරි තැනට බලය ඇත. සීල් තැබූ ටෙන්ඩර් පත් බාර ගත් බවට කුවිතාන්සියක් එවිට ටෙන්ඩර්කරු වෙත ඔහු විසින් නිකුත් කරනු ලැබේ.

5. සුප්‍රසිද්ධ නිෂ්පාදන සමාගමක ඒජන්තවරයෙකුට හෝ වෙළෙඳ නියෝජිතයෙකුට වුවද ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. එහෙත් අයදුම්කරු නම කරන ලද නිෂ්පාදන සමාගමේ නියෝජිත ඒජන්තවරයෙකු බව සහතික කළයු තු වෙයි. (මේ සඳහා නියෝජිතත්වය ඔප්පු කිරීමක් ඉදිරිපත් කළ යුතු වෙයි.) නැතහොත්,

5. ඒ. අයදුම්කරු මුදලින් රු. 100 ක් කොළඹින් පිට කච්චේරියක හෝ කොළඹ කොටුවේ යෝක් වීදියේ පිහිටි ලංකා බැංකුවේ හෝ තැන් පත් කර එසේ තැන්පත් කළ බවට ඔවුන්ගෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතු වෙයි. (කිනම් කොන්ත්‍රාත්තුවක් සඳහා කිනම් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීම සඳහා ද යන වග එම කුවිතාන්සියේ සඳහන් කර තිබිය යුතු වේයි. ලංකා බැංකුවේ එම මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය ආකෘතිපත්‍ර මෙහි 2 වන ඡේදයේ සඳහන් ලිපිනයේ ඇති සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

6. 1955 ඔක්තෝබර් 28 වෙනි දින අංක 10,854 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ සඳහන් අයුරු, සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 1949 සහ අංක 25 දරණ ආහාර හා ඖෂධ පනත යටතේ පනවන ලද රෙගුලාසි අනුව ඖෂධ විකිණීම සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැනගෙන් ලබා ගත් වලංගු බලපත්‍රයක් ඇති, බලයලත් වෙළෙඳුන්ගෙන් පමණක් මෙම සැපයීම සඳහා ටෙන්ඩර් පත් බාරගනු ලැබේ. ලාංකික සම්බන්ධතා ඇති රටවල් වූ ඇල්බේනියාව, ඔස්ත්‍රියාව, බල්ගේරියාව, චීන මහාජන සමූහාණ්ඩුව, චෙකොස්ලොවැකියාව, ටායිවාන්, ජර්මන් පෙඩරල් සමූහ ආණ්ඩුව, ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහ ආණ්ඩුව, හන්ගේරියාව, ජපානය, කොරියාව, පෝලන්තය, රුමේනියා මහාජන සමූහ ආණ්ඩුව, ස්පාඤ්ඤය, සෝවියට් රුසියාව, යුගොස්ලේවියාව, වියට්නාම් ප්‍රජාතන්ත්‍රවාදී සමූහ ආණ්ඩුව ආදී රටවලින් මෙම සැපයීම ආනයනය කර සැපයීමට බලාපොරොත්තු වන ටෙන්ඩර් කරුවන් වෙතොත්, ඔවුන් ලියා පදිංචි කරන ලද වෙළෙන්දන් විය යුතු අතර ආනයන පාලක තැන විසින් නිකුත් කරන ලද සාමාන්‍ය බඩු ගෙන්වීමේ වලංගු බලපත්‍රයක් ලත් ඇත්තෝ විය යුතුය. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලීමේදී ඉහත සඳහන් බලපත්‍රයක් හිමි බව ඔප්පු කළ යුතු වෙයි.

7. ටෙන්ඩර් කොන්දේසි සහ අනිකුත් විස්තර මෙම දැන්වීමේ 2 වන ඡේදයේ සඳහන් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැනගේ කාර්යාලයෙන් (කොන්ත්‍රාත් හා සැපයීම් අංශය) ලබා ගත හැක. මෙම කාර්යාලයෙන් ලබා ගත් ආකෘතිපත්‍ර, කොන්දේසිපත්‍ර ආදිය භාවිතා කළ හැක්කේ ස්වදේශීය ටෙන්ඩර්කරු වන්ට පමණි.

8. මෙහි පළමු වන ඡේදයෙහි සඳහන් පරිදි ටෙන්ඩර්කරු විසින් ස්වකීය ගණන් යෝජනාව ටෙන්ඩර් බාර ගැනීමේ අවසාන දින සිට යටත් පිරිසෙයින් මාස 2 ක් වත් විවෘතව තැබිය යුතුය.

9. කෙලින්ම ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට කැමති විදේශීය නිෂ්පාදක මූලිකවරුන් වෙත ඔවුන්ගේ ලංකා නියෝජිතයන් සහ ඒජන්තවරුන් විසින් ටෙන්ඩර් කොන්දේසි, උප ලේඛනය හා මෙම ටෙන්ඩරය පිළිබඳ සියළුම විස්තර පහත සඳහන් රටවල සිටින ලංකාණ්ඩුවේ නියෝජිතයන්ගෙන් ලබා ගත හැකි බව දැන්විය යුතුය. මහා බ්‍රිතාන්‍ය, ඇමරිකා එක්සත් ජනපදය, ඉතාලිය, පකිස්ථානය, ජපානය, ප්‍රංශය, බටහිර ජර්මනිය, චීන මහජන සමූහ ආණ්ඩුව, සෝවියට් රුසියාව, කැනඩාව, නෙදර්ලන්තය, බැල්ජියම, හංගේරියාව, බල්ගේරියාව, නැගෙනහිර ජර්මනිය, එක්සත් අරාබි සමූහ ආණ්ඩුව, බුරුමය, අයර් ලන්තය, අයිරානය, ඉරාකය, මාල දිවයින, උතුරු කොරියාව, ස්පාඤ්ඤය සහ ඉන්දියාවේ බොම්බාය සහ ඔස්ට්‍රේලියාවේ සිඩ්නිහි සිටින ලංකා වෙළෙඳ කොමසාරිස් සහ ලංකාවේ සිටින විදේශීය ආණ්ඩුවල නියෝජිතවරු සහ ඉන්දියාවේ දිල්ලියේ සිටින ලංකාවේ විදේශීය නියෝජිතයන්ගෙන්.

10. ටෙන්ඩර්කරුවන් වෙත ටෙන්ඩර් ආකෘතිපත්‍ර සමග නිකුත් කරන ලද ටෙන්ඩර් කොන්දේසිවල II වෙනි ඡේදය කෙරෙහි ටෙන්ඩර්කරුවන් ගේ අවධානය යොමු කරනු ලැබේ. කොළඹ, රජයේ බෙහෙත් ගබඩා අධිකාරිට යැවිය යුතු මෙම බඩුවල ආදර්ශ භාණ්ඩ (සැම්පල්ස්) සම්බන්ධ විස්තර එම ඡේදයෙහි සඳහන් කර ඇත. ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුත්තේ ටෙන්ඩර් පත් පමණි. ආදර්ශ භාණ්ඩ (සැම්පල්ස්) එහි තැන්පත් නොකළ යුතුය. ටෙන්ඩර් පත් සමාප්ත කරන දිනයේ නියම වේලාවට ප්‍රමාදව ලැබුණු සැම්පල්ස් සැලකිල්ලට භාජනය කරනු නොලැබේ.

11. මෙහි 1 වන ඡේදයේ සඳහන් ස්ථානයේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර පත්‍ර විවෘත කරන අවස්ථාවේ සෑම ටෙන්ඩර්කරුවෙකු ටම එම ස්ථානයේ සිටීමට අවසර තිබේ. ටෙන්ඩර්කරුවන්ගේ නම සහ මිළ ගණන් එහි පැමිණ සිටි ටෙන්ඩර්කරුවන්ට කියවනු ලැබේ. ලැබී තිබුණ ටෙන්ඩරයක් පරීක්ෂා කර බැලීමට යම්කිසි ටෙන්ඩර්කරුවෙකුට අවශ්‍ය නම්, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන සමග කටයුතු පිළියෙළ කර ගැනීමෙන් පසු එසේ පරීක්ෂා කර බැලීමට ඉඩ දෙනු ලැබේ.

12. ටෙන්ඩර්කරුවන් විසින් රුපියලේ වටිනාකම හා විදේශීය විනිමය වටිනාකම වෙන වෙනම තමන්ගේ මිළ ඉදිරිපත් කිරීම්වල සෑම විෂය අංකයක් වෙනුවනේ ම සඳහන් කළ යුතු වන්නේය.

එස් . බාලක්‍රිෂ්නන්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

1965.11.22 ද කොළඹ 10,
ඩීන්ස් පාරේ අංක 355 දරණ තැන පිහිටි,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) කාර්යාලයේ දී.

## අදළ උප ලේඛනය

| ද්‍රව්‍ය අංකය | විස්තරය | ඇස්තමේන්තු කළ අවශ්‍යතා | අවශ්‍ය ඇසිරීම |
|---|---|---|---|
| 1. | ඔරල් මැග්නීසියම් ක්ලොරයිඩ ස්ටැබලයිස්ට් ද්‍රව පෝලියෝ වැක්සින් කුප්පි තුළ සෑම කුප්පියක් තුළම ඩෝසස් 10 ක් අඩංගු විය යුතු ... ... ... | 5,00,000 ඩෝසස් | පහසු ආකාරයක ඇසිරීම |

බාරදීමේ ක්‍රමය.—

සම්පූර්ණ ප්‍රමාණයම, සුදුසු ආකාරයකට අසුරා සීතකර තුළ බහා එකම තොගයකින් ඇනවුම් කරන ලද දිනයේ සිට තෙමසක් ඇතුළත කොළඹ, රජයේ බෙහෙත් ගබඩාවට ගෙනැවිත් භාරදිය යුතුය.

2. ටෙන්ඩර්කරු ණයවර ලිපියක් ස්ථාපනය කරන ලෙස ආණ්ඩුවෙන් ඉල්ලා සිටින්නේ නම් මිළ යහ කොළඹට ගෙන ඊමේ ගාස්තු හා ඇසිරීම හා අනිකුත් සියළුම වියදම් සහිතව මිළ, භාණ්ඩ නිෂ්පාදන රටේ මුදලින් හා ලංකා මුදලින්ද සඳහන් කළ යුතුය. නැව් මාරුවට අවසර නොලැබේ.

3. සියළුම භාණ්ඩ හා ඒවා බහා එවන සියළුම භාජනවල '' ඔටුන්න ලකුණ '' හා එස්/පීඑම්එස්. 2729/65–66 යනුවෙන් සඳහන් කළ යුතුය.

11–1126—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

දුම්රිය දෙපාර්තමේන්තුවට "හයි පවර් බෝරින් ඇන්ඩ් ටර්නින් මිල්" සැපයීම සඳහා ටෙන්ඩර්පත්‍ර ප්‍රවාහන අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (ලිපිනය: 4 වැනි මහල, සෙලින්කෝ මන්දිරය, කොළඹ 1) 1966 පෙබරවාරි මස 23 වැනි බදාදා පෙරවරු 11.00 වන තෙක් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් ආකෘතිපත්‍ර නිකුත් කිරීමට පළමු ටෙන්ඩර්කරුවන් ඉහත සඳහන් සේවාව භාර ගැනීමට සහ හරියාකාරව ඉටු කිරීමට තමාගේ මුදල් තත්ත්වය ප්‍රමාණවත් බව අවශ්‍ය වුවහොත්, ඔප්පු කිරීම පිණිස ඒ සම්බන්ධයෙන් ලියකියවිලි ඉදිරිපත් කිරීමට සූදානම් විය යුතුයි.

3. මරදානේ දුම්රිය ගබඩා අධිකාරී තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි ෆෝර්ම කොළවල ටෙන්ඩරය ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි.

4. ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රු. 100 ක් මරදානේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී තැනගේ කාර්යාලයෙහි හෝ, කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1966.2.19 වැනි සෙනසුරාදා දහවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

5. 1966 පෙබරවාරි මස 24 වැනි බ්‍රහස්පතින්දා පෙරවරු 10.00 ට ප්‍රවාහන අමාත්‍යාංශ කාර්යාලයේදී ටෙන්ඩර්පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

6. වැඩි විස්තර දුම්රිය ගබඩා අධිකාරී තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

ඇම්. සරින්,
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.

1965 නොවැම්බර් මස 19 වන දින.

11–1037—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය

---

## ලංකා වානේ සංස්ථාව

### විදුලි සංදේශ ගොඩනැගිල්ලේ වායු සමන උපකරණ සැපයීම, සවිකැරුම හා නඩත්තුව

ඉහත සඳහන් වැඩය ඉටු කිරීම පිණිස මුද්‍රා සෙදූ ටෙන්ඩර් මෙයින් කැඳවනු ලැබේ.

මේ සඳහා ටෙන්ඩරය ලියැවිලි රු සටහන්, රු. 50 ක ආපසු නොගෙවන ගෙවීමකට අනතුරුව, අතුරුගිරියේ පිහිටි සංස්ථා කාර්යාලයෙන් ලබාගත හැකි යි.

ටෙන්ඩර ඒවා දමන ලියුම් කවරයේ, "වායුසමන උපකරණ සපයා සවිකිරීමට ටෙන්ඩර" යනු ලියා, 1965 දෙසැම්බර් 9 වන දින පෙරවරු 11 ට පෙර, අතුරුගිරියේ පිහිටි අප සංස්ථා කාර්යාලයේ ටෙන්ඩර පෙට්ටියේ තැන්පත් කළ යුතුයි.

සභාපති.

1965 නොවැම්බර් මස 16 දා.

11–974—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

කොළඹ ඩියුක් විදියේ විදේශ විදුලි සංදේශ ගොඩනැගිල්ලේ වැඩට අඟල් 3/4 ගල් කියුබ් 400 ක් සහ ගංගා වැලි කියුබ් 200 ක් සැපයීමට සහ ගෙනැවිත් බාර දීමට ටෙන්ඩර්පත් රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ අමාත්‍යාංශයෙහි ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1965 දෙසැම්බර් මස 22 වැනි බදාදා පෙරවරු 11 වන තෙක් බාරගනු ලැබේ.

එදිනම පස්වරු 2.30 ට ටෙන්ඩර් මණ්ඩල කායභාලයේදී ටෙන්ඩර් විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටිය හැක.

2. රත්මලානේ පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු තැනගේ කායභාලයෙහි දී ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂා කළ හැක. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායභාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක, ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 50 ක් තැන්පත්කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කර ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් ඉල්ලුම් කළ විට මේ සඳහා ටෙන්ඩර්පත් ලබාගත හැක. තැන්පත් කළ මුදල ආපසු ගෙවීම ටෙන්ඩර් කොන්දේසි අනුව කරනු ලැබේ.

මෙහි පහත සඳහන් ආයතනවලින් ටෙන්ඩර් තැන්පත් මුදල් අනවශ්‍යය :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය,

(ආ) මෙන ආණ්ඩුවල රාජ්‍ය වෙළඳ සංවිධාන, නිදර්ශන: චීන ජාතික යන්ත්‍රෝපකරණ ආනයන සංස්ථාව,

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්‍ෂ විසින් අනුමත කරන ලද. ග්‍රාම සංවර්ධන සමිති, සහ

(ඈ) සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කළ සමුපකාර සමිති.

3. මෙහි ඉහත සඳහන් පරිදි ලබාගත හැකි ආකෘති පත්වල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. 1965 දෙසැම්බර් මස 20 වෙනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් ලියකියවිලි නිකුත් කරනු ලැබේ.

4. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට ලාංකිකයින්ට සහ ලාංකික වෙළඳ සමාගම් හා අනිකුත් ලාංකික සමාගම්වලට පමණක් සීමා කර තිබේ.

ඈස්. සෙල්ලදුරෙයි,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

රජයේ වැඩ දෙපාර්තමේන්තුව,
කොළඹ 1, 65.11.22.

11–1125—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය

### ලංකා ගමනාගමන මණ්ඩලයේ ටෙන්ඩර් දැන්වීමයි

කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපති විසින් පහත සඳහන් සැපයීම් සඳහා ඒවා ඉදිරියෙන් දක්වා ඇති දිනයන්හි පෙරවරු 10 වන තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ:—

| සැපයීම | | ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය |
|---|---|---|
| 1. පොත් පත් මුද්‍රණය කර සැපයීම (මෙරටට පමණක් සීමා වේ) | ... | 1965.12.22 |
| 2. ඇලුමිනියම් ෂීට් සහ ට්‍රෙඩ් ප්ලේට් සැපයීම ... | ... | 1966. 1.12 |
| 3. ඇලුමිනියම් එක්ස්ට්‍රූෂන් සැපයීම | ... | 1966. 1.12 |

ටෙන්ඩර් පත්‍ර නියමිත ලෙස ලියා අනුපිටපතකින්ද යුක්තව සකස් කොට එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලබන්නේ කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයේ වූ ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන ගිණුම් නිලධාරි වෙත රු. 100ක ටෙන්ඩර් තැන්පත් මුදලක් එක් එක් ටෙන්ඩරය සඳහා තැන්පත් කොට ඒ සම්බන්ධව නිකුත් කරනු ලබන රිසිට් පත්‍රය වේරහැර බොරලැස්ගමුවේ පිහිටි ප්‍රධාන සම්පාදක නිලධාරිගේ කාර්යාලය වෙත ඉදිරිපත් කළ පසුය. ටෙන්ඩර් පත්‍රිකා භාරගන්න අවසාන දිනට පෙර දින දවල් 12 වන තෙක් මාගේ කාර්යාලයෙන් ලබාගත හැකිය.

වැඩි විස්තර ප්‍රධාන සම්පාදක නිලධාරිගේ කාර්යාලයෙන් දැනගත හැකිය.

ඇස්. ඇම්. එච්. ෆාසි,
ප්‍රධාන සම්පාදක නිලධාරි තැන,
ලංකා ගමනාගමන මණ්ඩලය.

1965 ක්වූ නොවැම්බර් මස 26 දින,
වේරහැර, බොරලැස්ගමුව.

11-1081—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය.

## තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

### ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය

**1965 ජූලි 30 වැනි දින භාර ගැනීම අවසන් කළ සිමු පට කබදාසි මලු විසි ලක්ෂයක් සැපයීම සඳහා වූ ටෙන්ඩර්වල ප්‍රතිඵල**

**ටෙන්ඩර්කරුවන්ගේ නම්**

1. සීමාසහිත මිත්සුබිෂි ෂෝජි කයිෂා සමාගම, ටෝකියෝ, ජපානය.
2. සීමාසහිත ඇන්ග්ලෝ ඒසියන් සමාගම, කොළඹ.
3. ස්විපෝට් ඇන්. වී. සම.ගම, ඇම්ස්ටර්ඩෑම්, ඕලන්දය.
4. ස්කැපෙක්ස් — ස්කැන්ඩිනේවියන් පේපර් ඇන්ඩ් පල්ප් එක්ස්පෝට් සමාගම, ස්වීඩනය.
5. ශ්‍රී ලංකා ට්‍රේඩිං සමාගම, කොළඹ 11.
6. සීමාසහිත පේපර් සැක්ස් සමාගම, එංගලන්තය.
7. සීමාසහිත බෝවෝටර් පැකිං සමාගම., එංගලන්තය.
8. සීමාසහිත සැන්ට් රෙජිස් කොන්සොලිඩේටඩ් පැකිං සම:ගම, කැනඩාව.
9. සීම:සහිත ජැන් ලිබර්ග් සමාගම, ස්වීඩනය.
10. ඉන්ටර්නැෂනල් පැකිං සමාගම, කරච්චි, පකිස්තානය.
11. වොල්ටමේරි ඔසාකෙයිපියෝ සමාගම, හෙල්සින්කි, ෆින්ලන්තය.
12. ඊස්ට්—වෙස්ට් ඇස්. ආර්. ඇල්. සමාගම, ඉතාලිය.
13. සීමාසහිත ඒ. ඒබ්‍රහම්ස් සහ පුත්‍ර සමාගම, ඔස්ට්‍රේලියාව.
14. සීමාසහිත සිලෝන් පේපර් සැක්ස් සමාගම, කොළඹ.

පමා වූ ටෙන්ඩර්

15. සීමාසහිත ඇම්. කේ. ෂිපිං ඇන්ඩ් චාටරිං සමාගම., ඉන්දියාව.
16. ග්‍රැහැම්—ඉන්ඩස්ට්‍රියා: ඩි ඩෙපල් ඩා අබෙල්හෙයිරා ඇස්. ඒ. ආර්. ඇල්. සමාගම, පෘතුගාලය.

**සාර්ථක ටෙන්ඩර්කරු**

| නම සහ ලිපිනය | මිල |
|---|---|
| සීමාසහිත මිත්සුබිෂි ෂෝජි කයිෂා සමාගම., ටෝකියෝ, ජපානය. | කොළඹට මි.ර.භා.ගා. ප. 22.13.0. |

පී. ආර්. එදිරිවීර,
ජ්‍යෙෂ්ඨ සැපයීම් නිලධාරි

11-1115—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය.

## බඩු බාහිරාදිය විකිණීම්

### කැලෑ දෙපාර්තමේන්තුවේ දැව දඬු වෙන්දේසියේ විකිණීමයි

කැලෑ දෙපාර්තමේන්තුවේ දකුණු දිසාභාර වන නිලධාරි විසින් හම්බන්තොට ජංගම ලිමෝලේ තිබෙන ඉරාපු දැව, කඳන්, පිටපත් සහ දර තොග 97ක් 1965 දෙසැම්බර් මස 13 වැනි දින පෙරවරු 9.30ට දැව තිබෙන ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. වෙන්දේසියේ දැව ඉල්ලුම් කිරීමට අදහස් කරන්නන්ට ඒ ඒ ස්ථානයන් වෙත ගොස් දැව පරීක්ෂා කිරීමට අවසර දෙනු ලැබේ.

2. වෙන්දේසියේදී දැව ඉල්ලුම් කිරීමට අදහස් කරන අය වෙන්දේසි අවස්ථාවේදී කියවනු ලබන කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කළ යුතුය. මෙම වෙන්දේසිය සම්බන්ධයෙන් වැඩිදුරටත් විස්තර අවශ්‍ය අයට දකුණු දිසාභාර වන නිලධාරි තුමාගේ කාර්යාලයෙන් හෝ හම්බන්තොට අඩවි වන නිලධාරිගෙන් හෝ පැමිණ ලබාගත හැක.

ඊ. ඩබ්ලිව්. සෙනවිරත්න,
දකුණු දිසා වන නිලධාරි.

1965 නොවැම්බර් මස 11 වැනි දින,
ගාල්ලේදීය.

11-1088—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය.

### කැලෑ දෙපාර්තමේන්තුව

**දැව වෙන්දේසියේ විකිණීම**

කැලෑ දෙපාර්තමේන්තුවට අයත්, කොළඹ ඌරුගොඩවත්ත අංක 2 දරණ මධ්‍යම දැව ගබඩ.වේ ඇති ඝන අඩි 1,436.3කින් සමන්විත ඉරූ දැව තොග 15ක් 65.12.3 වෙනි දින උදේ 10ට එම ගබඩාවේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දැව වෙන්දේසියේ මිලදී ගැනීමට අදහස් කරන අයට එම ස්ථාන යට ගොස් දැවවල තත්ත්වය හා මිනුම් ප්‍රමාණ ගැන බලා සෑහීමට පත්විය යුතුය. සෑම තොගයක් සඳහාම වැඩිම ලංසුව තබන්නා, විකිණීම අවසන්වූ වහාම දැවවල සම්පූර්ණ මුදල ගෙවා වෙන්දේසිය පැවැත්වූ දින සිට රජයේ වැඩ කරන දින 3ක් ඇතුලතදී, දැව සම්පූර්ණයෙන් ඉවත් කරගත යුතුවේ.

වැඩි විස්තර කොළඹ 2, වන සංරක්ෂකගේ කාර්යාලයෙන් හෝ, ඌරුගොඩවත්ත අංක 2 දරණ මධ්‍යම ගබඩාවේ ගබඩාකරුගෙන් හෝ පැමිණ ලබාගත හැක.

වී. ජේ. වීරරත්න,
වැඩ බලන වනසංරක්ෂක වෙනුවට.

වන සංරක්ෂණ කාර්යාලයය,
තැ. පෙ. 509,
කිච්පාර, කොළඹ 2,
1965.11.20.

11-1086—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය.

## කැලෑ දෙපාර්තමේන්තුව—දැව වෙන්දේසියේ විකිණීම

කුරුණෑගල අඩවියේ ඇති අළුත කපන ලද, කිරිකෝන්, පලු, මිල්ල, වැවරණ, බුරුත, හා පානක්කා කඳන් 128කින් සමන්විත ඝණඅඩි 1404.7ක් 1965 දෙසැම්බර් මස 3 වන දින උදය 10ට කුරුණෑගල අඩවි කැලෑ කාර්යාලයේදී වයඹ දිසා කැලෑ නිලධාරි විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉල්ලුම්කරුවන්ට දැව වෙන්දේසියට පෙර පරීක්ෂා කර බැලිය හැක.

වැඩි විස්තර සඳහා කුරුණෑගල අඩවි වන නිලධාරි හෝ වයඹ දිසා කැලෑ නිලධාරි විමසන්න.

ස. මුත්තයියා,
වයඹ දිසාභාර කැලෑ නිලධාරි.

දිසා කැලෑ කාර්යාලය,
කුරුණෑගල, 65.11.13.

11-1089—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය

---

## කැලෑ දෙපාර්තමේන්තුව—දැව වෙන්දේසියේ විකිණීම

මැල්සිරිපුර අඩවියේ කිරිදිගල්ල මාර්ගාසන්න ගබඩාවේ ඇති අළුත කපනලද, කොස්, මැහොගනී, මිල්ල, හල්මිල්ල හා ලුනු මිදෙල්ල කඳන් 1,610 කින් සමන්විත ඝණ අඩි 7,937.4ක් 1965 දෙසැම්බර් මස 3 වන දින උදය 10ට කුරුණෑගල අඩවි කැලෑ කාර්යාලයේදී වයඹ දිසා කැලෑ නිලධාරි විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දැව වෙනදේසියට පෙර ඉල්ලුම්කරුවන්ට පරීක්ෂාකර බැලිය හැක.

වැඩි විස්තර සඳහා වයඹ දිසා කැලෑ නිලධාරි හෝ කුරුණෑගල අඩවි වන නිලධාරි විමසන්න.

ස. මුත්තයියා,
වයඹ දිසාභාර කැලෑ නිලධාරි.

දිසා කැලෑ කාර්යාලය,
කුරුණෑගල, 65.11.12.

11-1087—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය

---

## කැලෑ දෙපාර්තමේන්තුව—දැව වෙන්දේසියේ විකිණීම

කිතුල්ගල අඩවියේ ඇති කැටකෑල, කිරිකෝන්, මිල්ල දූන්, හොර, හල්, පෙලන්, ඌරුකණු, වැලිඅන්න, කිරිහැඹිලිය, කෑකුන, කටුබොඩ හා මලබොඩ කඳන් 94 කින් සමන්විත ඝණ අඩි 1258.6 ක්ද, දවුල් කුරුඳු හා උළුඳු ඉරු ලී කෑලි 31 කින් සමන්විත ඝන අඩි 25.1 ක්ද, දූන් සිලිපර 17 ක්ද, 1965 දෙසැම්බර් මස 14 වෙනි දින උදය 10 ට කිතුල්ගල අඩවි කැලෑ කාර්යාලයේදී වයඹ දිසා කැලෑනිලධාරි විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉල්ලුම්කරුවන්ට දැව වෙන්දේසියට පෙර පරීක්ෂා කර බැලිය හැක.

වැඩි විස්තර සඳහා වයඹ දිසා කැලෑ නිලධාරි හෝ කිතුල්ගල අඩවි වනනිලධාරි විමසන්න.

ස. මුත්තයියා,
වයඹ දිසාභාර කැලෑ නිලධාරි.

65.11.12 වෙනි දින,
දිසා කැලෑ කාර්යාලය,
කුරුණෑගල.

11-1090—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

### වැඩිපුර ඇති බ්‍රේක් ලයිනින් විකිණීම

රත්මලානේ ගාලු පාරේ 126 වෙනි ස්ථානයෙහිවූ ලංගම වැඩිපුර බඩු විකිණීම් මධ්‍යස්ථානයේ පහත සඳහන් මෝටර් රථ වර්ගවලට අයත් බ්‍රේක් ලයිනින් විකිණීමට තිබේ:—

ඒ.ඊ.සී.
ඉන්ටර්නැෂනල්
ෆේඩ්
වෙවලට්-ලෝඩ්මාස්ටර්
කොමර්
ගයි
ඩොජ්
ඔස්ටින්-මොරිස් කොමර්ෂල්

විකිණීම් මධ්‍යස්ථානයේ භාරකාර මහතාගෙන් ඒවායේ මිල ගණන් හා විස්තර දැනගත හැකිය. ඒ ස්ථානයේදී මේ බ්‍රේක් ලයිනින් බැලීමටද පුළුවන.

ඇස්. ඇම්. එච්. ෆිජාසී,
ප්‍රධාන සම්පාදක නිලධාරි තැන,
ලංකා ගමනාගමන මණ්ඩලය.

1965 නොවැම්බර් මස 15 වෙනි දින,
බොරලැස්ගමුවේ වේරහැර සම්පාදක කොට්ඨාශයේ දිය.

11-1001—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය

---

## ප්‍රසිද්ධ වෙන්දේසියක්

### මාතර මහෙස්ත්‍රාත් උසාවිය

අයිතිකරුවන් නැති පහත සඳහන් බඩු බාහිරාදිය ම විසින් 1966 ජනවාරි මස 5 වැනි දින පෙ. ව. 11 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. 1966 ජනවාරි මස 2 වැනි දින සිට 4 වැනි දින දක්වා පස්වරු 3 සිට 4.30 දක්වා බඩු මිළදී ගැනීමට අදහස් කරන්නන්ට සැම්පල් රෙදි සහ අනෙකුත් බඩු බාහිරාදිය පරීක්ෂා කිරිමට අවසර දෙනු ලැබේ.

2. වෙන්දේසියේදී බඩු මිළදී ගැනීමට අදහස් කරන අය වෙන්දේසි අවස්ථාවේදී කියවනු ලබන කොන්දේසි වලට අනුව ක්‍රියා කළ යුතුයි. මෙම වෙන්දේසිය සම්බන්ධයෙන් වැඩි දුරටත් විස්තර මගෙන් ලබා ගත හැක.

| බඩුවල විස්තර | ගණන |
| --- | --- |
| 1. රත්තරන් වාටිය සහිත සිල්ක් වේට්ටි ... | 146 |
| 2. රත්තරන් වාටිය සහිත සිල්ක් උතුරු සළු ... | 226 |
| 3. සාරි (සිල්ක් 1, කපු 2) ... ... | 3 |
| 4. කමිස ... ... | 2 |
| 5. දිග කලිසම් ... ... | 1 |
| 6. පාතිමා ප්‍රතිමා ... ... | 1 |
| 7. හිස් ගෝනි ... ... | 163 |
| 8. විදුලි පන්දම්—පළමුවන කොටස ... | 1 |

උසාවියේ අණ පරිදි,

ඇස්. අබේවික්‍රම,
ප්‍රධාන ලිපිකරු,
මාතර මහෙස්ත්‍රාත් උසාවිය.

1965 නොවැම්බර් මස 15 වැනි දින,
මාතර මහෙස්ත්‍රාත් උසාවියේදීය.

11-957—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය

## ගස් වෙන්දේසියක්

මහනුවර දිස්ත්‍රික්කයේ තුම්පනේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය තුල පිහිටි, මෙහි පහත විස්තර දක්වන ගස් 1965 ක්වූ දෙසැම්බර් මස 6 වෙනි දින අපර භාග 3 ට ගලගෙදර පිහිටි තුම්පනේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාලයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. වෙන්දේසියේ දී මෙම ගස් ඉල්ලුම් කිරීමට අදහස් කරන අයවළුන්, වෙන්දේසි දිනට කලින් මෙම ගස් පරීක්ෂා කර බලා සෑහීමකට පත්විය යුතුයි. මෙම ගස් සහ පිහිටි ස්ථානය පිළිබඳ විස්තර තුම්පනේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගෙන් ලබාගත හැක.

3. සෑම ගසක් හෝ ගස් තොගය වැඩිම මුදලට ඉල්ලා ලබා ගන්නා අය එම ගස්වල සම්පූර්ණ වටිනාකමෙන් 25%ක් එවේලේම තැන්පත් කළ යුතු අතර ඉතිරි මුදල සතියක් ඇතුලත ගෙවා ගස් ඉවත් කර ගත යුතුයි.

පී. ඇස්. බී. අදිකාරම්,
මහනුවර දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1965 ක්වූ නොවැම්බර් මස 16 වැනි දින,
මහනුවර කච්චේරියේ දිය.

### ගස්වල විස්තර මෙසේයි

| පිහිටා තිබෙන්නේ | වර්ගය | වටඅඩි | උස අඩි | ඝන අඩි | ලන්සුව රු. | ශ. |
|---|---|---|---|---|---|---|
| හතරලියද්ද මහා විද්‍යාලය | කොස් | 10 | 12 | 79 | 118 | 50 |
| හතරලියද්ද මහා විද්‍යාලය | කොස් | 6 | 10 | 21 | 31 | 50 |
| හතරලියද්ද මහා විද්‍යාලය | කොස් | 3 | 15 | 9 | 13 | 50 |
| උඩුව තැන්නේගෙදර හේන | කොස් | 4.8″ | 45 | 29 | 43 | 50 |
| වැලිවිට පහලගම | කොස් | 4 | 12 | 9 | 13 | 50 |
| වැලිවිට පහලගම | කොස් | 3 | 12 | 3 | 4 | 50 |
| වැලිවිට පහලගම | කොස් | 4 | 18 | 11 | 17 | 88 |
| නරවත්ත | කොස් | $4\frac{1}{2}$ | 30 | 25 | 44 | 75 |
| හත්බැවේ වත්ත | කොස් | 4.7″ | 20 | 19 | 25 | 46 |
| පල්ලේපොල පාර | කොස් | 3.10″ | 20 | 11 | 16 | 50 |
| පල්ලේපොල පාර | කොස් | $4\frac{1}{2}$ | 16 | 19 | 28 | 50 |
| පල්ලේපොල පාර | කොස් | 4.1″ | 13 | 15 | 22 | 50 |
| පල්ලේපොල පාර | කොස් | $5\frac{1}{2}$ | 24 | 35 | 52 | 50 |
| කොලුගල | කොස් | 4.5″ | 35 | 42.7″ | 50 | 53 |
| හතරලියද්ද ආරෝග්‍යශාලා භූමිය | කොස් | 3.9″ | 15 | 9 | 27 | 0 |
| හතරලියද්ද ආරෝග්‍යශාලා භූමිය | කොස් | 4.2″ | 10 | 10 | 30 | 0 |
| හතරලියද්ද ආරෝග්‍යශාලා භූමිය | කොස් | 14.6″ | 15 | 15 | 45 | 0 |
| හතරලියද්ද ආරෝග්‍යශාලා භූමිය | කොස් | $3\frac{1}{2}$ | 15 | 9 | 27 | 0 |
| හතරලියද්ද ආරෝග්‍යශාලා භූමිය | කොස් | 6.8″ | 45 | 78 | 234 | 0 |
| ගුනදහ ග්‍රා. සේ. වසම | කොස් | $3\frac{1}{2}$ | 9 | 6 | 18 | 0 |
| ගුනදහ ග්‍රා. සේ. වසම | කොස් | 3 | 7 | 2 | 6 | 0 |
| ගුනදහ ග්‍රා. සේ. වසම | පොල් | — | — | — | 2 | 50 |
| මීනිගමුව රිටිගහතැන්න | කොස් | 9 | 8 | 36 | 108 | 0 |
| මීනිගමුව රිටිගහතැන්න | කොස් | $4\frac{1}{2}$ | 10 | 10 | 30 | 0 |
| මීනිගමුව රිටිගහතැන්න | කොස් | $4\frac{1}{2}$ | 6 | 10 | 30 | 0 |
| මීනිගමුව රිටිගහතැන්න | කොස් | 2 | 10 | 2 | 6 | 0 |
| මීනිගමුව ගිනිහපුවෙහේන | කොස් | $3\frac{3}{4}$ | 30 | 13 | 39 | 0 |
| | | | එකතුව | 527.7″ | 1,086 | 12 |

11-944—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය

---

## පොලිස් දෙපාර්තමේන්තුව

### භාවිච්චියට ගත නොහැකි නිල ඇඳුම්, බයිසිකල් හා වෙනත් ද්‍රව්‍ය වෙන්දේසිය

වයඹ පළාතේ පොලිස් අධිකාරි තැනගේ බඩු ගබඩාවේදී භාවිච්චියට ගත නොහැකි නිල ඇඳුම්, බයිසිකල් හා වෙනත් ද්‍රව්‍යයන් 1965 දෙසැම්බර් 4 වැනි දින පෙරවරු 9.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බැව් දැනුම් දෙමි.

කාර්යාල වේලාවන් තුළදී එම බඩු පරීක්ෂාකර බැලිය හැකිය. වෙන්දේසිය අවසාන වූ විගසම මුදල් ගෙවා බඩු ගෙනයා යුතුය.

සී. එච්. විජේසිංහ,
ව. ප. පොලිස් අධිකාරි වෙනුවට.

1965 නොවැම්බර් මස 15 වැනි දින,
පොලිස් කාර්යාලය,
කුරුණෑගල.

11-994—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## බෙදුම් නඩු තීන්දුවක් යටතේ ප්‍රසිද්ධ ඉඩම් වෙන්දේසියක්

මාතර දිස්ත්‍රික් උසාවියේ දීය

මාගල්ලගොඩ සමරවික්‍රම විදානපතිරනගේ සිවුන්දිරිස් ............................................................................ පැමිණිලිකරු.

නො. 20046 එදිරිව

කොටුවගොඩ, මාතර මොහමඩ් කාසි සිත්ති ඇඩ්ලිමා සහ තවත් ............................................................ විත්තිකාරයෝ.

ඉහත සඳහන් නඩුවෙන් මට ලැබී තිබෙන බලය ප්‍රකාර මෙහි සඳහන් දේපල ප්‍රථම කොට තක්සේරු මිලට උරුමක්කාරයින් අතරේ වෙන්දේසිකර ඔවුන් ඉදිරිපත් නුනොත් එවෙලේම එම ස්ථානයේදී මහජනයා අතරේ වර්ෂ 1965 ක්වූ දෙසැම්බර් 18 වැනි දින පෙරවරු 10 සිට එම ස්ථාන වලදීම පිළිවෙලින් විකුණනු ලැබේ.

එනම්:—දකුණු පලාතේ මාතර දිස්ත්‍රික්කයේ ගඟබඩ පත්තුවේ හල්පෙ නමැති ගමේ පිහිටි එච්. ඇස්. ඩයස් මිනින්දෝරු මහතා විසින් සාදන ලද අංක 305 දරණ ප්ලෑන කඩඇසියේ සඳහන් බෙද වෙන්කරන ලද ආනන්දවිල යන කුඹුරේ නො. 1 දරණ කැබැල්ලෙන් බෙද වෙන්කල අංක 1 දරණ කැබැල්ලට මායිම්, උතුරට : වලව්වේ විලද, නැගෙනහිරට : මෙම ඉඩමේ නො. 2 දරණ කැබැල්ල සහ අඩි 3 පාර ද, දකුණට : අමරකෝන් විලද, බස්නාහිරට : වැල්ලයාගෙ විලද යන මායිම් තුල රුඩ් තුනකුත් පර්චස් විසිපහක් විශාල ඉඩම වේ.

තක්සේරු මුදල රු. 450 යි

2. ඉහතකී ආනන්දවිල යන කුඹුරේ නො. 1 දරණ කැබැල්ලෙන් බෙදා වෙන් කරන ලද නො. 2 දරණ කැබැල්ලට මායිම්:—උතුරට : වලව්වෙවිල ද, නැගෙනහිරට : නො. 3 දරණ එම ඉඩමේ කැබැල්ල ද, දකුණට : අඩි තුනේ පාර ද, බස්නාහිරට : මෙම ඉඩමේ නො. 1 දරණ කැබැල්ල ද යන මායිම් තුල රුඩ් තුනකුත් පර්චස් විසිපහක් විශාල ඉඩම වේ.

වේලාව 10.30. තක්සේරු මුදල රු. 450 යි

3. ඉහතකී ආනන්දවිල යන කුඹුරේ නො. 1 දරණ කැබැල්ලෙන් බෙදා වෙන්කරන ලද නො. 3 දරණ කැබැල්ලට මායිම්, උතුරට : වලව්වෙවිල ද, නැගෙනහිරට : නො. 4 දරණ කැබැල්ල ද, දකුණට : අඩි තුනේ පාරද, බස්නාහිරට : මෙම ඉඩමේ නො. 2 දරණ කැබැල්ල ද යන මායිම් තුල රුඩ් තුනකුත් පර්චස්-විසිපහක් විශාල ඉඩම වේ.

වේලාව 11. තක්සේරු මුදල රු. 450 යි

4. ඉහතකී ආනන්දවිල යන කුඹුරේ බෙදා වෙන්කල නො. 1 දරණ කැබැල්ලෙන් බෙදා වෙන් කරන ලද නො. 4 දරණ කැබැල්ලට මායිම්, උතුරට : වලව්වෙවිල ද, නැගෙනහිරට : මෙම ඉඩමේ නො. 5 දරණ කැබැල්ල ද, දකුණට : අඩි තුනේ පාර ද, බස්නාහිරට : මෙම ඉඩමේ නො. 3 දරණ කැබැල්ල ද යන මායිම් තුල රුඩ් තුනකුත් පර්චස් විසිපහක් විශාල ඉඩම වේ.

වේලාව 11.30. තක්සේරු මුදල රු. 450 යි

5. ඉහතකී ආනන්දවිල යන කුඹුරේ නො. 1 දරණ කැබැල්ලෙන් බෙදා වෙන් කරන ලද නො. 5 දරණ කැබැල්ලට මායිම්, උතුරට : වලව්වෙවිල සහ ප්ලෑන් නො. 2281 දරණ ප්ලෑනේ පෙනෙන ලොට් 1ඊ දරණ ඉඩමද, නැගෙනහිරට : මෙම ඉඩමේ නො. 6 දරණ කැබැල්ල ද, දකුණට : අඩි තුනේ පාර ද, බස්නාහිරට : නො. 4 දරණ කැබැල්ලද යන මායිම් තුල රුඩ් තුනකුත් පර්චස් විසිපහක් විශාල ඉඩම වේ.

වේලාව 12. තක්සේරු මුදල රු. 450 යි

6. ඉහතකී ආනන්දවිල යන කුඹුරේ නො. 1 දරණ කැබැල්ලෙන් බෙදා වෙන් කරන ලද නො. 6 දරණ කැබැල්ලට මායිම්, උතුරට : වලව්වෙවිල සහ ප්ලෑන් නො. 2281 කේ සඳහන් ලොට් 1 ඊ දරණ කැබැල්ල ද ලොට් කිව් අක්ෂරය දරන වතුර අගලද, නැගෙනහිරට : ප්ලෑන් නො. 2281 කේ සඳහන් ලොට් 2 ඇල් සහ 2 කේ දරණ කැබලි ද, දකුණට : අඩි තුනේ පාරද, නො. 2281 දරණ ප්ලෑනේ සඳහන් ලොට් කිව් දරණ අක්ෂරයෙන් සඳහන් වතුර බසිනා ඇලද, නො. 2281 දරණ ප්ලෑනේ සඳහන් ලොට් ආර් දරණ කැබැල්ල ද, බස්නාහිරට : මෙම ඉඩමේ නො. 5 දරණ කැබැල්ල සහ අඩි තුනේ පාරද, යන මායිම තුල අක්කර එකක් විශාල ඉඩම වේ.

වේලාව 12.30. තක්සේරු මුදල 500 යි

මුළු තක්සේරු මුදල රු. 2,750 යි

විකිණීමේදී කියවා දෙන කොන්දේසි පරිදි වෙන්දේසි උනි නම් නමත් ගන්නා ලද මුදලින් 1/4 පංගුවත් සමග කොමසාරිස් තැනගේ සියලුම ගාස්තු ගෙවිය යුතුයි. තවද, කොන්දේසි ඔප්පු සහතික කිරීමේ මුද්දර ගාස්තුව සහ නිතිඥ තැනගේ ගාස්තුව ද එවෙලේ ගෙවිය යුතුයි. ඉතිරි මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුලත උසාවියට ගෙවිය යුතුයි. මේ සම්බන්ධ වැඩි විස්තර නිතිඥ ඇස්. ඩයස් මහතා ගෙන් හෝ මගෙන් විමසන්න.

ජාන් ද සිල්වා කපුකොටන,
උසාවියේ කොමසාරිස් තැන සහ
ප්‍රසිද්ධ වෙන්දේසිකාර තැන.

" කීර්ති ", හිත්තටිය, මාතර.

11-1075—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය.

---

# විවිධ දැන්වීම්

## නත්තල් ගස් විකිණීම—1965

1965 නත්තලට, නත්තල් ගස් සැපයිම සඳහා නුවරඑළියේ ප්‍රාදේශීය වන නිලධාරි විසින් 1965 දෙසැම්බර් මස 15 වැනි දින දක්වා ඉල්ලුම්පත් භාරගනු ලැබේ.

2. පට්ටිපොල වන රක්ෂකගේ නිවාසයෙන් ලබාගත හැකි නත්තල් ගස්වල මිල මෙසේ යි :—

| | | |
|---|---|---|
| උස අඩි 3 දක්වා | ... ගසක් රු. | 4 0 |
| උස අඩි 7 දක්වා | ... ගසක් රු. | 7 0 |
| උස අඩි 10 දක්වා | ... ගසක් රු. | 12 0 |
| උස අඩි 12 දක්වා | ... ගසක් රු. | 14 0 |

3. පැමිණ ලබාගත නොහැකි අයදුම්කරුවන්ට දිවයිනේ ඕනෑම දුම්රිය පොළකට නත්තල් ගස් දුම්රියෙන් යවනු ලැබේ. ඒ සඳහා දුම්රිය ගාස්තුවත් සමග මිල මෙසේ යි :—

| | | |
|---|---|---|
| උස අඩි 3 දක්වා | ... ගසක් රු. | 4 50 |
| උස අඩි 7 දක්වා | ... ගසක් රු. | 8 50 |
| උස අඩි 10 දක්වා | ... ගසක් රු. | 15 0 |
| උස අඩි 12 දක්වා | ... ගසක් රු. | 18 0 |

4. දුම්රියෙන් යවන ගස් නැතිවීම ගැන මෙම දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ. ඒ පිළිබඳව එවන කිසිම පැමිණිල්ලක් ගැන මෙම දෙපාර්තමේන්තුව විභාග නොකරයි.

5. සියළුම ඉල්ලුම්පත් නුවරඑළියේ දිසාපති නමට ලබාගත් මනි ඕඩරයක්/පෝස්ටල් ඕඩරයක් සහිතව පහත සඳහන් විස්තර ඇතුව මා වෙත ඉදිරිපත් කළ යුතුයි :—

(ඒ) ගසේ දිග හා අවශ්‍ය ගස් ගණන.

(බී) ගස් දුම්රියෙන් යැවිය යුතු දිනය හා ඒවා දුම්රිය පොලෙන් ලබාගැනීමට අපේක්ෂා කරන දිනය.

(සී) ගස් යැවිය යුතු දුම්රියපොල.

6. කළින් මුදල් නොඑවන කිසිම ඉල්ලීමකට ගස් එවනු නො ලැබේ. චෙක් පත් භාරගන්නේ නැත.

7. අවශ්‍ය විස්තර රහිතව ඉදිරිපත් කරන ඉල්ලීම්වලට කලට වේලාවට ගස් නොසැපයීම ගැන මේ දෙපාර්තමේන්තුව වග නො කියයි.

8. 1965 දෙසැම්බර් මස 15 වැනිදායින් පසු ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

සී. ලී. ඩී. පෙරේරා,
ප්‍රාදේශීය වන නිලධාරි, උඩරට දිසාව.

දිසා කැලෑ කාර්යාලය,
නුවරඑළිය,
1965 නොවැම්බර 4 දින.

11-432—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය.

## නිවේදනයයි

1966 පෙබරවාරි මස 4 වන දිනට යෙදෙන නිදහස සමරු උළෙල නිමිත්තෙන් එදින රාත්‍රියේ මහා ගිණිකෙළි ප්‍රදර්ශන තරගයක් කුරුණෑගල (වැව අසල) පැවැත්වීමට අදහස් කර ඇත. එහි පළමුවන තැන ගන්නා ප්‍රදර්ශනයට රු. 1,000ක ත්‍යාගයක්ද, දෙවන තැන ගන්නා ප්‍රදර්ශනයට රු. 500ක ත්‍යාගයක්ද, තුන්වන තැන ගන්නා ප්‍රදර්ශනයට රු. 250ක ත්‍යාගයක්ද ගරු ස්වදේශ කටයුතු ඇමතිතුමා අතින් පිරිනැමෙනවා ඇත.

ගිණිකෙළි ප්‍රදර්ශන තරගයට ඇතුළත් වීමට කැමති බලය ලත් ගිණි කෙළි නිපදවන්නන් ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ඒ බැව් දන්වා එවීමෙන් අවශ්‍ය ෆෝර්ම හා විස්තර 1965 දෙසැම්බර් මස 15 වන දිනට පෙර ලබාගත හැකි වෙනවා ඇත.

ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
වොරින්ටන් චතුරශ්‍රය,
1965 නොවැම්බර් මස 15 වැනි දින.

11–924—65.11.26 දින අංක 14,569 දරන ගැසට් පත්‍රය.

සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායක මුදල් භාරගනු නොලැබේ.

ලංකාවේ වැලව්වේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි.